# කාර්ය සාධන වාර්තාව - 2012

# වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව


# செயலாற்றுகை அறிக்கை 2012

# வனசீவராசிகள் பாதுகாப்பு திணைக்களம்

# Performance Report – 2012

# Department of Wildlife Conservation





# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දේශීය ශාක හා සත්ව ප්‍රජාවන් සංරක්ෂණය කිරීම ජාතික වශයෙන් ප්‍රමුඛ ප්‍රතිපත්තියකි. ඒ අනුව ශ්‍රී ලංකාවේ දේශ සීමාව තුළ වනජීවී සම්පත් ආරක්ෂා කිරීමේ හා සංරක්ෂණය කිරීමේ ප්‍රමුඛ කාර්යයභාර්ය පැවරී ඇත්තේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටය. ඒ සඳහා ශ්‍රී ලංකාව තුළ වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලයක් ස්ථාපිත කර කළමනාකරණය කිරීමේ නීතිමය වගකීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරී ඇති අතර එසේ ස්ථාපිත කරන ලද රක්ෂිත භූමි ප්‍රමාණයේ මුළු එකතුව වර්ග කි.මි. 8500 ක් ඉක්මවයි. එය ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් 13% ක් පමණ වේ. පහත දැක්වෙන වගුවෙහි දැක්වෙන්නේ ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශයට පත් කර ස්ථාපිත කරන ලද වනජීවී රක්ෂිත භූමි වර්ග සහ ඒවායේ සංඛ්‍යාවන්ය. මෙරට වනජීවී රක්ෂිත ලංකාව තුළ පිහිටා ඇති ආකාරය ඇමුණුම 1 හි දැක්වේ.

| **රක්ෂිත ප්‍රදේශ වර්ගය** | | **දැනට ප්‍රකාශයට පත්කර ඇති සංඛ්‍යාව** |
|---|---|---|
| ජාතික රක්ෂිත | දැඩි ස්වභාව රක්ෂිත | 03 |
| | ජාතික උද්‍යාන | 22 |
| | ස්වභාව රක්ෂිත | 05 |
| | වන පිවිසුම් | 01 |
| **එකතුව** | | **31** |
| අභයභූමි | | 65 |
| **මුළු එකතුව** | | **96** |

විවිධත්වයෙන් පොහොසත් මෙරට ජෛව සම්පත් ඒවායේ ස්වභාවික වාසස්ථාන සමඟ සංරක්ෂණය කරනවාට අමතර වශයෙන් වනජීවී රක්ෂිත  ප්‍රදේශ ජාලය ශ්‍රී ලංකාව තුළ පවත්නා කෘෂිකාර්මාන්තයට සහ විදුලිබල නිෂ්පාදනයට වැදගත් වන විශාල ප්‍රමාණයේ ජලාශ සහ ඒවායේ පෝෂක ප්‍රදේශද ආරක්ෂා කරයි. සේනානායක සමුද්‍රය ඇතුළු ගල්ඔය ද්‍රෝණියේ ජලාශ සියලුම මහවැලි ජලාශ මධ්‍යම සහ උතුරු මැද පළාත්වල පිහිටි මහවැලි ගඟෙන් ජලය ලබා ගන්නා ජලාශ උඩවලව, මව්ආර, ලුණුගම්වෙහෙර සහ වෙහෙරගල යනාදී මෙරට දකුණු ප්‍රදේශයේ පවත්නා ජලාශ වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලය තුළ පිහිටයි. තවද, පරාක්‍රම සමුද්‍රය, කවුඩුල්ල, මින්නේරිය, ගිරිතලේ, පදවිය, කලාවැව සහ යෝධ වැව වැනි ප්‍රධාන වැව් රාශියකද ජල පෝෂක ප්‍රදේශ වනජීවී රක්ෂිත ප්‍රදේශ ලෙස සංරක්ෂණයට ලක්කර ඇත. මෙසේ වනජීවී රක්ෂිත ප්‍රදේශ තුළ පිහිටන කෘෂිකාර්මික වශයෙන් සහ ජල විදුලිය නිෂ්පාදනය සඳහා වැදගත් වන ජලාශ සංඛ්‍යාව 40 ඉක්මවයි.

තවද මහවැලි, කැළණි, කළු සහ වලවේ යන ප්‍රධාන ගංගාවල්වල ඉහළ ජල පෝෂක ප්‍රදේශද පිහිටා ඇත්තේ සමනළ අඩවිය ස්වභාව රක්ෂිතය, හෝර්ටන්තැන්න ජාතික උද්‍යානය වැනි වනජීවී රක්ෂිත තුළය.

මෙකී තත්වයන් යටතේ ශ්‍රී ලංකාව තුළ පවත්නා ඉතා වටිනා ස්වභාවික පරිසර පද්ධතීන් සහ ඒවායේ ඇති සම්පත් මනා වෘත්තිමය කළමනාකරණයක් සහ සංරක්ෂණයක් සිදුකිරීම සඳහා ආධාරවන පරිදි මෙම දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙය සංවිධානය කර ඇත.

**දැක්ම:** වර්තමාන සහ අනාගත පරම්පරාවන් සඳහා වනජීවී උරුමයන් සංරක්ෂණය කිරීම.

**මෙහෙවර :** සහභාගිත්ව කළමනාකරණය මඟින් වනජීවී උරුමයන් සංරක්ෂණය තහවුරු කිරීම.

ශ්‍රී ලංකාවේ ජාතික වනජීවී ප්‍රතිපත්තියේ නිර්ණායකයන්ට අනුව ජාතික සහ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව සකස් කරන ලද උපායමාර්ග, සැලසුම් සහ වැඩසටහන් මඟින් ජාතික ආර්ථිකයට මහත් දායකත්වයක් සපයන පරිදි මෙම වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලය කළමනාකරණය කරනු ලැබේ.

වර්තමාන ගෝලීය දැක්ම අනුව විද්‍යාත්මකව තීරණ ගැනීම, සංකීර්ණ දත්ත හා තොරතුරු වඩා කාර්යක්ෂමව සන්නිවේදනය සහ කළමනාකරණය, සංරක්ෂණය සහ සංවර්ධනය තුලනය කළහැකි වන පරිදි පිළියෙල කළ දිගුකාලීන කළමනාකරණ සැලසුම්, අමුත්තන් සඳහා අධ්‍යාපනික සහ විනෝදාශ්වාද අවස්ථා විවිධත්වයක් සහිතව සැපයීම සහභාගිත්ව කළමනාකරණය සහ ප්‍රතිලාභ සාධාරණ ලෙස පාර්ශවකරුවන් අතර බෙදීයාමට සැළැස්වීම මඟින් ප්‍රාදේශීය ප්‍රජාවන් සංරක්ෂණයට දායක කර ගැනීම වැනි ක්ෂේත්‍ර සඳහා වැඩි අවධානයක් යොමු වෙමින් පවතී.

මේ තත්වය යටතේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ තම මෙහෙයුම් අඛණ්ඩව වැඩිදියුණු කරමින් ක්‍රියාත්මක කිරීමට පෙළඹී ඇත. ඒ අනුව හඳුනාගත් දෙපාර්තමේන්තුවේ අරමුණු පහත පරිදිය.

- ජාතික හා අන්තර්ජාතික ප්‍රතිපත්තීන් හා ගැලපෙන අයුරින් වනජීවී සම්පත් සංරක්ෂණය සඳහා උපායමාර්ගික ජාතික සැලසුම් සහ වැඩසටහන් සම්පාදනය කිරීම.
- සුවිශේෂී විද්‍යාත්මක වැදගත්කමක් සහිත ස්ථානද සහිතව රට තුළ පවත්නා සියලුම ස්වභාවික පරිසර පද්ධතීන් නියෝජනය වන පරිදි රක්ෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීම ඒවා කාලානුරූපව සහ වනජීවී විශේෂ වල ධරණීය ගහන පවත්වා ගෙන යාහැකි ආකාරයට සංඛ්‍යාත්මකව සහ ප්‍රමාණාත්මකව වැඩිදියුණු කිරීම සහ ඒවා අතර සම්බන්ධතා ස්ථාපිත කිරීම.
- වඩාත් සුදුසු පර්යේෂණ දත්ත හා තොරතුරු මත පදනම්ව රක්ෂිත ප්‍රදේශ හඳුනාගැනීම, වර්ගීකරණය කිරීම හා කළමනාකරණය කිරීම සහ ඒවායේ තත්වයන් යාවත්කාලීන සුපරික්ෂාව.
- අන්තරායට ලක් වූ විශේෂ සඳහා සංරක්ෂණ සැලසුම් පිළියෙල කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.
- අදාල රක්ෂිත ප්‍රදේශ තුළ පරිසර පද්ධතීන් සංරක්ෂණය කරන අතරම පාරිසරික සංචාරක කටයුතු සඳහා ඇති අවස්ථාවන් භාවිතා කිරීමේ පහසුකම් සැපයීම.
- රට තුළ වනජීවී සම්පත් වල නීතිවිරෝධී භාවිතයන් අවම කිරීම සඳහා වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත සහ වෙනත් රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාව තුළ වනජීවී සම්පත් කළමනාකරණයට අදාල වන විද්‍යාත්මක පර්යේෂණ දිරිගැන්වීම.

- පුහුණු කිරීම්, දිරිගැන්වීම සහ අභිප්‍රේරණය මගින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලයේ හැකියාවන් වර්ධනය කිරීම.

- අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් මහජනතාව තුළ සංරක්ෂණය සඳහා දක්වන දායකත්වය ඉහළ නැංවීම.

- රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත ප්‍රජාවන් එකී රක්ෂිත ප්‍රදේශ මත යැපීම අඩුකිරීම සහ එම ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික තත්වයන් වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීම මඟින් සංරක්ෂණය සඳහා එකී ප්‍රජාවන්ගේ දායකත්වය ඉහළ නැංවීම.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර අනුව කටයුතු කිරීම සඳහා ප්‍රධාන කාර්යාල මට්ටමින් ප්‍රධාන තාක්ෂණික අංශ 08කි. ඒවා නම්, සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය, ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය, අලි සංරක්ෂණ අංශය, සංචාරක සේවා පාරිසරික සංචාරක සේවා හා ජනවිඥිදුම්කරණ අංශය, පර්යේෂණ හා පුහුණු අංශය, ආරක්ෂණ හා නීති ක්‍රියාත්මක කිරීම් අංශය සහ වනජීවී සෞඛ්‍ය අංශය වේ. එයට අමතරව ගිණුම්, පරිපාලන සහ ඉංජිනේරු අංශ පෙරකී තාක්ෂණික අංශ සඳහා සහායක කාර්යභාර්යක් ඉටුකරයි. මෙම අංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර අංක 1 සිට 11 දක්වා පරිච්ඡේදවල දක්වා ඇත.

දීප ව්‍යාප්තව ස්ථාපිත කර ඇති වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලය තුළ හා ඉන් බාහිරව සිදුකළ යුතු වනජීවී සංරක්ෂණ කටයුතු ප්‍රාදේශීය වශයෙන් මෙහෙයවීමට සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය පරිපාලන සඳහා කලාප 7ක් 2012 වර්ෂය දක්වා ක්‍රියාත්මක කරනු ලැබීය. එකී කලාප 7 ඇමුණුම 02 න් දැක්වේ.

නමුත් උතුරු හා නැගෙනහිර පළාත්වල ඇතිකළ සාමකාමී වාතාවරණයත් සමඟ එම ප්‍රදේශවලටද වනජීවී සංරක්ෂණ කටයුතු ව්‍යාප්ත කිරීමටත් දිවයින පුරා වනජීවී සංරක්ෂණ ක්‍රියාකාරකම් තීව්‍ර කිරීමටත් පහසුවන පරිදි 2012 සිට නව ප්‍රාදේශීය පරිපාලන කළාප ව්‍යුහයක් හඳුන්වාදෙන ලදී. ඒ අනුව 2012.07.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය පරිපාලන ව්‍යුහය කලාප 11කට බෙදී යන පරිදි සංශෝධනය කරන ලදී. එසේ සංශෝධිත නව කලාප ව්‍යුහය ඇමුණුම 03 හි දැක්වේ.

ඉහත එක් එක් කලාපයේ ප්‍රධානියා නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ වරයෙකු වන අතර එකී කලාපය තුළ පිහිටන රක්ෂිත ප්‍රදේශ ජාලය අඩවි හා බීට්ටු ලෙස නැවත බල ප්‍රදේශ වලට වෙන්කර පාලනය කරනු ලැබේ.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තුළ වනජීවී සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ දැනුම කුසලතා සහ ආකල්ප වැඩිදියුණු කිරීම සඳහා ගිරිතලේ පිහිටි ජාතික වනජීවී අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානය විසින් නිත්‍ය පුහුණු පාඨමාලා පැවැත්වීම මඟින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

2012 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම උදෙසා රුපියල් මිලියන 1131.3 ක ප්‍රතිපාදන ඒකාබද්ධ අරමුදලින් ලැබුණි. ඊට අමතරව වනජීවී සංරක්ෂණ අරමුදලේ ප්‍රතිපාදන ද මොරගහකන්ද සහ වෙහෙරගල වාරිමාර්ග වලින් ලැබෙන ප්‍රතිපාදන ද දානපතීන් සහ ආධාර සපයන ආයතන වලින් ලැබෙන මුදල් ද විවිධ සංරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට යොදාගන්නා ලදී.

2012 වර්ෂ අවසාන ගිණුම් වලට අනුව පුනරාවර්තන වියදම් 100% ක් ලෙසද ප්‍රාග්ධන වියදම් 65% ක් ලෙසද සතුටුදායක මූල්‍ය ප්‍රගතියක් පෙන්වා ඇත. (ඇමුණුම් 2)

# පරිච්ඡේදය 1
## සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය

### 1.1 ප්‍රධාන කාර්යයන් සහ වගකීම්

- වනජීවිසංරක්ෂණදෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම.
- විශේෂ සංවර්ධන සහ සංරක්ෂණ කටයුතු සඳහා ව්‍යාපෘති යෝජනා සැකසීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රගතිය පසුවිපරම් කිරීම.
- මාසික (කාර්තුමය) ත්‍රෛයිමාසික හා වාර්ෂික වාර්තා පිළියෙල කිරීම.
- දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කිරීම.
- දෙපාර්තමේන්තුවේ www.dwc.gov.lk වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු දීපව්‍යාප්ත රේඩියෝ සන්නිවේදන පද්ධතිය නඩත්තුව, කළමනාකරණය සහ වැඩිදියුණු කිරීම.
- දෙපාර්තමේන්තුව සතු අභ්‍යන්තර දුරකථන ජාල පද්ධතිය කළමනාකරණය, නඩත්තුව සහ වැඩිදියුණු කිරීම.
- වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දීප ව්‍යාප්ත පරිගණක ජාලය කළමනාකරණය,නඩත්තුව හා වැඩිදියුණු කිරීම.
- ජාතික උද්‍යානවල ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම පරිගණකගත කිරීම.
- GIS ඒකකය කළමනාකරණය

### 1.2 කාර්යය සාධනය 2012

2012 වර්ෂය තුළදී පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් සිදුකරන ලදී.

- **ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම**

  වනජීවිසංරක්ෂණදෙපාර්තමේන්තුවේ 2013 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සම්පාදනය කර වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

- **ප්‍රගතිය වාර්තා කිරීම**

  මාසික සහ කාර්තුමය ප්‍රගතිය දැක්වෙන වාර්තා පිළියෙල කර නියමිත පරිදි ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.මෙම ප්‍රගති වාර්තා වල 'ගජ මිතුරෝ'අලි සංරක්ෂණ ව්‍යාපෘතිය,හොරොව්පතාන හා ලුණුගම්වෙහෙර වනඅලි සංරක්ෂණ උද්‍යාන ස්ථාපිත කිරීම හා 'දැයට කිරුළ' ජාතික සංවර්ධන ව්‍යාපෘතියට අදාලවද ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.

  ඊට අමතරව එක් එක් ආයතන වලින් ඉල්ලා සිටින පරිදි පිළියෙල කරන ලද ප්‍රගති වාර්තාද එකී ආයතන වෙත ලබා දෙන ලදී.

- **කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීම**

  ක්‍රියාත්මක කරන ලද ක්රියාකාරී සැලැස්මේ ප්‍රගතිය සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වෙනත් සංරක්ෂණ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය විදහා දැක්වෙන පරිදි තොරතුරු යොදාගනිමින් 2012 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව පිළියෙල කරන ලදී.

- **විශේෂ ව්‍යාපෘති යෝජනා පිළියෙල කිරීම**

රක්ෂිත ප්‍රදේශ ජාලය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ සංවර්ධන සහ සංරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය විසින් ව්‍යාපෘති යෝජනා පිළියෙල කර මහාභාණ්ඩාගාරය සහ වෙනත් මූල්‍ය ප්‍රභව වලට ඉදිරිපත් කරන ලදී. 2012 වර්ෂය සඳහා මූල්‍ය පහසුකම් ලබාගැනීමට සුදුසුකම් ලද ව්‍යාපෘති යෝජනා හා මෙම යෝජනා සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ලද අරමුදල් පහත සඳහන් වගු අංක 1.1 හි දැක්වේ.

**වගුව 1.1:** මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට සුදුසුකම්ලත් විශේෂ ව්‍යාපෘති යෝජනා

| ව්‍යාපෘති යෝජනාව | ව්‍යාපෘතියේ මුළු වියදම (රු. මිලියන) | 2012 වර්ෂයේදී ලැබීමට නියමිත ප්‍රතිපාදන (රු. මිලියන) | ප්‍රතිපාදන මූලාශ්‍රය |
|---|---|---|---|
| විදුලි වැට ඉදිකිරීම | 100.00 | 100.00 | ඒකාබද්ධ අරමුදල |
| හොරොව්පොතාන හා ලුණුගම්වෙහෙර වනඅලි සංරක්ෂණ උද්‍යාන ඉදිකිරීම | 835.00 | 100.00 | ඒකාබද්ධ අරමුදල |
| දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන | 100.00 | 100.00 | ඒකාබද්ධ අරමුදල |

- **වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු Wide Area Network කළමනාකරණය**

වර්තමාන පරිගණක පද්ධතියේ පවතින අලුත්වැඩියාවන් හා පාලන කටයුතු සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශයට අනුයුක්ත කාර්ය මණ්ඩලය විසින් සිදුකරන ලදී. මෙම ක්‍රියාකාරකම් තුළ පරිගණක හා උපාංග අලුත්වැඩියා, පුළුල් ප්‍රදේශ ජාලගතකරණයේදී සිදුවන අවහිරතා ඉවත් කිරීම්, පරිගණක සඳහා නව මෘදුකාංග හා දෘඩාංග ස්ථාපිත කරමින් ජාලයේ කටයුතු පවත්වාගෙන යාම වේ.

හෝර්ටන්තැන්න හා විල්පත්තු ජාතික උද්‍යානවල පරිගණක ආශ්‍රිත ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ පද්ධතිය ස්ථාපිත කිරීමේ කාර්යයන් සම්පූර්ණ කරන ලදී.

- **වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ www.dwc.gov.lk වෙබ් අඩවිය කළමනාකරණය කිරීම.**

දැනට භාවිතා කරනු ලබන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය අධ්‍යාපනික හා පර්යේෂණ වටිනාකමක් ඇති දත්ත හා තොරතුරු ඇතුළත් කරමින් අඛණ්ඩවම යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලදී. මෙම සමස්ථ කාර්යාවලිය සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශයට අනුයුක්ත කාර්ය මණ්ඩලය විසින් සිදුකරන ලදී.

- **රේඩියෝ සන්නිවේදන ජාලය**

දැනට භාවිතාවන රේඩියෝ සන්නිවේදන පද්ධතියේ ආවරණ කලාපය වැඩිදියුණු කිරීම, යාවත්කාලීන නඩත්තු කටයුතු සිදුකිරීම සහ බාධාවලින් තොරව සන්නිවේදන ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම මගින් මෙම ජාලය මගින් සිදුකරන ලදී. මෙම

සමස්ථ කාර්යාවලිය සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශයට අනුයුක්ත තාක්ෂණ ශිල්පීන් විසින් ක්‍රියාත්මක කරන ලදී.

- **GIS ඒකකය කළමනාකරණය කිරීම**

ක්ෂේත්‍රයේදී රැස්කරන ලද GPS දත්ත භාවිතා කරමින් විවිධ අවශ්‍යතාවන් සඳහා අදාල වන විවිධ තේමාවන් යටතේ සිතියම් පිළියෙල කරන ලදී. ඒ යටතේ සිතියම් පිළියෙල කල ප්‍රධාන තේමාවන් පහත දැක්වේ.

- පවත්නා සහ යෝජිත විදුලිවැට
- නව වනජීවී පාලන සීමාවන්
- අළුතින් යෝජිත අලි සංරක්ෂණ කලාප හා අලි සංචිත කළමනාකරණය
- මාදුගඟ සහ අකුරල අභය භූමිය

එයට අමතරව සුවිශේෂී තේමා යටතේ පිළියෙල කිරීමට ඉල්ලුම් කරන ලද සිතියම්ද ප්‍රධාන කාර්යාලීය අංශ සහ ක්ෂේත්‍ර කාර්යාලවල ඉල්ලීම පරිදි සිදුකරන ලදී.

- **2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් සම්බන්ධ වැඩසටහන.**

2012 වර්ෂය තුළදී සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් වගුව 1.2 හි දැක්වේ.

**වගුව 1.2 :** ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය -2012

| අනු අංකය | ක්‍රියාකාරකම | විස්තරය | වියදම (රු.'000) |
|---|---|---|---|
| 1 | ජාතික උද්‍යානයන්හි පරිසනක ගත කිරීම. ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ පද්ධතිය යාවත්කාලීන කිරීම අඛණ්ඩව සිදු කරනු ලබයි.<br>- වර්තමාන පද්ධති යාවත්කාලීන කිරීම<br>- හෝර්ටන් තැන්න ජාතික උද්‍යාන සඳහා ලැප්ටොප් පරිගණකයක් මිලදී ගැනීම | ලැප්ටොප් පරිගණකයක් මිලදී ගන්නා ලදී | 107.0 |
| 2 | ප්‍රධාන කාර්යාලය සඳහා දුරකථන 50ක් මිලදී ගැනීම | 25ක් පමණ මිලදී ගන්නා ලදී | 186.0 |
| 3 | දෙපාර්තමේන්තුව සතු wide Area Network වැඩි දියුණු කිරීම | සිදුකරන ලදී | 536.0 |
| 4 | ප්‍රින්ටරය සහ UPS සහිත සර්වර් පරිගණක 02 මිලදී ගැනීම | පරිගණක 02ක්,මුද්‍රණ යන්ත්‍ර 02ක් හා බැටරි 02ක් මිළදී ගන්නා ලදී | 220.0 |
| 5 | සන්නිවේදන පද්ධතිය නඩත්තු කිරීම හා උපකරණ මිලදී ගැනීම් | මිලදී ගැනීම් සිදුකර ඇති අතර නඩත්තු කටයුතු නොකඩවා සිදු කරනු ලබයි. | 71.0 |
| 6 | සන්නිවේදන පද්ධතිය සඳහා බැටරි 100ක් මිළදී ගැනීම | 50ක් මිළදී ගන්නා ලදී | 307.0 |
| **එකතුව** | | | **1427.0** |

# පරිච්ඡේදය 2
# ස්වභාවික සම්පත් කළමණාකරන අංශය

## 2.1. ප්‍රධාන කාර්යයන් සහ වගකීම්

- රක්ෂිත ප්‍රදේශ සඳහා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම සහ සංශෝධනය.
- රක්ෂිත ප්‍රදේශ සඳහා සම්පත් වට්ටෝරු පිළියෙල කිරීම සහ යාවත්කාලීන කිරීම.
- රක්ෂිත ප්‍රදේශ ජාලය විමර්ෂණය කිරීම සහ රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම.
- රක්ෂිත ප්‍රදේශ මායිම් මිනුම් කිරීම සහ සලකුණු කිරීම.
- වනජීවි වාසස්ථාන කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය සහ පසුවිපරම් කිරීම.
- ආක්‍රමණශීලි විශේෂ පාලන කටයුතු ක්‍රියාත්මක කිරීම.
- ගිනිපටි සහ වනජීවී වාසස්ථාන වල සංඝටක කළමනාකරණය
- පරිසර දූෂණය පාලනය සහ වනජීවි විශේෂ ආරක්ෂා කිරීමේ සැලසුම් සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය
- රක්ෂිත ප්‍රදේශ තුළ යෝජිත සංවර්ධන කටයුතු සඳහා පරිසර ශක්‍යතා අධ්‍යනය සිදුකිරීම.
- රටේ සංවර්ධන ව්‍යාපෘති සඳහා පරිසර ශක්‍යතා අධ්‍යනය කටයුතු වලට සහභාගිවීම.
- රම්සා සම්මුතියේ ශ්‍රී ලංකාව තුළ පරිපාලන අධිකාරිය වශයෙන් ක්‍රියාත්මක වීම.

## 2.2 රක්ෂිත ප්‍රදේශ ජාලය ස්ථාපිත කිරීම

- රක්ෂිත ප්‍රදේශ ජාලය ශක්තිමත් කිරීම සඳහා එම රක්ෂිත ප්‍රදේශවල මායිම් මිනුම් කිරීම සහ සලකුණු කිරීම සිදුකරන ලදී. ඒ යටතේ 2012 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද මායිම් සලකුණු කිරීමේ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය 2.1 වගුවෙහි දැක්වේ.

වගුව **2.1** : රක්ෂිත ප්‍රදේශ මායිම් මිනුම් කිරීම හා සලකුණු කිරීම - 2012

| වනජීවි කලාපය | වනජීවී රක්ෂිතය | මිනුම්/සළකුණු කරන ලද මායිම්වල මුළු දිග/කණු සංඛ්‍යාව |
|---|---|---|
| අනුරාධපුර | විල්පත්තුව ජාතික උද්‍යානයේ නැගෙනහිර සීමාව | කි.මී.13(කණු 129) |
| මධ්‍යම | වික්ටෝරියා රන්දෙණිගල රන්ටැඹේ අභයභූමි | කණු 151 |
| | හග්ගල දැඩි ස්වභාව රක්ෂිතය | කණු 121 |
| නැගෙනහිර | පානම-කුඩුම්බිගල අභයභූමිය | කි.මී.13(කණු 129) |
| | ගල්ඔය ජාතික උද්‍යානය | කණු 100 |
| පොළොන්නරුව | සෝමාවතිය ජාතික උද්‍යානය | කණු 600 |
| | මාදුරුඔය ජාතික උද්‍යානය | කණු 121 |
| බස්නාහිර | මාදුගහ අභයභූමිය | කි.මී.3 |

- රක්ෂිත ප්‍රදේශවල මායිම් සඳහා දැන්වීම් පුවරු සකස් කරන ලදී. වගුව 2.2 හි මෙසේ රක්ෂිත ප්‍රදේශවල ස්ථාපනය කරන ලද දැන්වීම් පුවරු පිළිබඳ තොරතුරු දැක්වේ.

වගුව **2.2**: දැන්වීම් පුවරු ස්ථාපනය හා ප්‍රතිසංස්කරණය කිරීම - 2012 වසර

| වනජීවී කලාපය | වනජීවී රක්ෂිත ප්‍රදේශය/කාර්යාලය | දැන්වීම් පුවරු සංඛ්‍යාව |
|---|---|---|
| අනුරාධපුර | මිහින්තලය අභයභූමිය | 4'x2'- 04<br>10'x15' - 01 |
| මධ්‍යම | වික්ටෝරියා රන්දෙනිගල රංටැඹේ අභයභූමිය | 16 |
| | කලාප කාර්යාලය-මධ්‍යම | 01 |
| | උනගොල්ල බිට්ටුව | 05 |
| | ගැල්වේස්ලැන්ඩ් ජාතික උද්‍යානය | 09 |
| | හග්ගල දැඩි ස්වභාව රක්ෂිතය | 02 |
| නැගෙනහිර | කුමන උද්‍යානය | 07 |
| | පානම-කුඩුම්බිගල අභයභූමිය | 16 |
| පොළොන්නරුව | පරෙවි දූපත් ජාතික උද්‍යානය | 03 |
| | කලාප කාර්යාලය- පොළොන්නරුව | 01 |
| දකුණ | උස්සන්ගොඩ ජාතික උද්‍යානය | 01 |
| | කලාප කාර්යාලය-දකුණ | 01 |
| | ඇත් අතුරු සෙවන- (උඩවලව) | 03 |
| ඌව | කලාප කාර්යාලය-ඌව | 1 |
| බස්නාහිර | හොරගොල්ල ජාතික උද්‍යානය | 12 (ප්‍රතිසංස්කරණය) |
| | හොරගොල්ල ජාතික උද්‍යානය | 02 (ස්ථාපනය) |
| | මුතුරාජවෙල අභයභූමිය | 12 |
| | ශ්‍රී ජයවර්ධනපුර අභයභූමිය | 5 |
| | කලාප කාර්යාලය-බස්නාහිර | 1 |
| | මාදුගහ | 1 |

## 2.3 වන ජීවීන් සඳහා වාසස්ථාන සුපෝෂණය

වන ජීවීන් සඳහා වාසස්ථාන සුපෝෂණය යටතේ ආක්‍රමණශීලි විශේෂ ඉවත් කිරීම, තෘණභූමි කළමනාකරණය , ගිනිපටි කළමනාකරණය යන ක්‍රියාකාරකම් ප්‍රමුඛ වේ. වගු 2.3, 2.4, 2.5ල 2.6 සහ 2.7 මගින් 2012 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද වාසස්ථාන සුපෝෂණ කටයුතු දැක්වේ.

වගුව **2.3**: 2012 වර්ෂය තුල වනජීවී කලාප වල තෘණභූමි කළමනාකරණය

| වනජීවී කලාපය | වනජීවී රක්ෂිතය | ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|---|
| බස්නාහිර | හොරගොල්ල ජාතික උද්‍යානය නඩත්තුව | 1/12(නඩත්තුව) |
| | හොරගොල්ල ජාතික උද්‍යානය ස්ථාපිත කිරීම | 1/5(නව ස්ථාපනය කිරීම) |

වගුව **2.4**: 2012 වසර තුළ ආක්‍රමණශිලි විශේෂ ඉවත් කිරීම - 2012

| වනජීවී කලාපය | වනජීවී රක්ෂිතය | ප්‍රමාණය (හෙක්ටයාර්/අක්කර ) |
|---|---|---|
| අනුරාධපුර | තබ්බෝව අභයභූමියේ යුක්ලිප්ටස් ඉවත් කිරීම | 138'×74' ගස් - 20 |
| | තබ්බෝව අභයභූමියේ කළපු අන්දර ඉවත් කිරීම | හෙක්. 21 |
| නැගෙනහිර | කුමන ජාතික උද්‍යානයේ මාර්ගය දෙපස වූ ආක්‍රමණශීලී විශේෂ ඉවත් කිරීම | හෙක්. 30.13 |

| | | |
|---|---|---|
| | ලාහුගල ජාතික උද්‍යානය ආක්‍රමණශීලී විශේෂ ඉවත් කිරීම | අක්.08 |
| දකුණ | උඩවලව ජාතික උද්‍යානය ආක්‍රමණශීලී විශේෂ ඉවත් කිරීම | හෙක්. 62.5 |
| ඌව | යාල ජාතික උද්‍යානයේ ලැන්ටානා ඉවත් කිරීම | හෙක්. 01 |
| බස්නාහිර | බෙල්ලන්විල අත්තිඩිය අභයභූමිය ආක්‍රමණශීලී විශේෂ ඉවත් කිරීම | හෙක්. 2.5 |

වගුව **2.5**: ගිනිපටි කළමනාකරණය – 2012

| වනජීවි කලාපය | වනජීවී රක්ෂිතය | ප්‍රමාණය (හෙක්ටයාර්/කි.මී) |
|---|---|---|
| මධ්‍යම | වික්ටෝරියා රන්දෙනිගල රන්ටැඹේ- වික්ටෝරියා රන්දෙනිගල රන්ටැඹේ- කීර්තිබණ්ඩාරපුර | හෙක්.03 |
| | උණගොල්ල | හෙක්.04 |
| දකුණ | උඩවලව | කි.මී.30 |

වගුව **2.6**: පැල සිටුවීමේ වැඩසටහන් - 2012

| වනජීවි කලාපය | රක්ෂිත ප්‍රදේශ | ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|---|
| නැගෙනහිර | බාගුරා කළපුව-කුමන ජාතික උද්‍යානය | (පැළ 1500) |
| | කුමන විල්ලුව-කුමන ජාතික උද්‍යානය | (පැළ 1500) |
| පොළොන්නරුව | වස්ගමුව ජාතික උද්‍යානය | හෙක්.01(පැළ 156) |
| බස්නාහිර | කහපොළ- රිජීඩේල්වත්ත | (පැළ 100) |

වගුව **2.7**: දිය වලවල් ඉදිකිරීම - 2012

| වනජීවි කලාපය | රක්ෂිත ප්‍රදේශය | ප්‍රමාණය(සංඛ්‍යාව) |
|---|---|---|
| නැගෙනහිර | කුමන ජාතික උද්‍යානය | 04 |

## 2.8 මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ වනජීවි සංරක්ෂණ කටයුතු

මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ වනජීවි සංරක්ෂණ කටයුතු සිදුකිරීම වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී ව්‍යාපෘති බල ප්‍රදේශයේ වනඅලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග වලට ප්‍රමුඛතාවය ලබාදී ඇත. මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද වනජීවි සංරක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරයක් වගුව 2.8 හි දැක්වේ.

වගුව **2.8:** 2012 වර්ෂයේ මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ වූ වනජීවි සංරක්ෂණ කටයුතු

| අනු අංකය | ක්‍රියාකාරකම | වෙන්කරන ලද ප්‍රතිපාදන (රු.‘000) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය(රු.‘000) |
|---|---|---|---|---|
| 1 | පුහුණුවන් වැඩ සටහන් | 135 | 100% | 135.0 |
| 2 | සදවාසල කන්ද-පුබ්බිලිය විදුලි වැටේ බලශක්ති කුටිය ඉදිකිරීම | 6358 | බල ශක්ති කුටි 2ක්, 30කි.මී. දිග විදුලි වැට ඉදිකර ඇත. | 846.0 |
| 3 | මැදිරිගිරිය ඩී- විදුලි වැට | 13,944. | විදුලි වැට,කණු සහ අවශ්‍යා උපකරණ මිළදී ගෙන ඇත. | 3055.0 |
| 4 | කළුගග ව්‍යාපෘතිය යටතේ වස්ගමුව | 7,500 | - | 183.0 |

| | | | | |
|---|---|---|---|---|
| | -රන්දූන වැව විදුලි වැට ඉදිකිරීම - කි.මී 15 | | | |
| 5 | අංගම්මැඩිල්ල ජාතික උද්‍යානයේ තෘණ වගාකිරීම | 163 | වැඩ සිදුකරමින් පවතී. | 136.0 |
| 6 | ගිනිපටි කළමනාකරණය - වික්ටෝරියා රන්දෙනිගල රන්ටැඹේ | 5,000 | 17% | 399.0 |
| 7 | නාමපුවරු සැකසීම වස්ගමුව ජාතික උද්‍යානය | 774 | - | 166.0 |
| 8 | මහවැලි ජී- විදුලි වැට | 20 | නව විදුලි කුටි 4ක් ඉදිකර ඇත. | 15.0 |
| 9 | සිංගල් කැබ් රථ 02ක් මිළදී ගැනීම | 6,000 | මිළදී ගෙන ඇත. | 5687.7 |
| 10 | වස්ගමුව දකුණ- විදුලි වැට | 5,000 | විදුලි වැට සඳහා උපකරණ මිළදී ගන්නා ලදී. | 14699.3 |
| 11 | පුබ්බිලිය- විදුලි වැට | 7,658 | ටෙන්ඩර් ප්‍රධානය කර කාර්යය අරඹා ඇත. | 1562.3 |
| 12 | රජ්ජම්මන බීට්ටු කාර්යාලය ඉදිකිරීම | 3,500 | 50% | 536.0 |
| 13 | කවුඩුල්ල බීට්ටු කාර්යාලය | 3,500 | 100% | 783.0 |
| 14 | වස්ගමුව ජාතික උද්‍යානය - නිළධාරීන්ගේ කුසලතා සංවර්ධනය පිළිබඳ වැඩමුළුව | 18 | 100% | 18.0 |
| **එකතුව** | | **79,550** | | **43,403.4** |

වගුව 2.9: 2012 වසරේ ක්‍රියාකාරී සැලැස්මේ කටයුතුවල ප්‍රගතිය

| අනු අංකය | ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මූල්‍යමය ප්‍රගතිය රු.('000) |
|---|---|---|---|
| **2001-1 පෝෂක ප්‍රදේශ ජාලය ස්ථාපිත කිරීම** | | | |
| 1 | සෝමාවතිය ජාතික උද්‍යානයේ මායිම් සළකුණු කිරීම | 519 මායිම් කණු ස්ථාපිත කිරීම | 1,652.0 |
| 2 | මායිම් සළකුණු කිරීම- මාදුරුඔය ජාතික උද්‍යානය | 121 මායිම් කණු ස්ථාපිත කිරීම | 381.0 |
| 3 | මායිම් සළකුණු කිරීම- වික්ටෝරියා රන්දෙනිගල රන්ටැඹේ අභයභූමිය | 100% සම්පූර්ණයි | 497.0 |
| 4 | මායිම් සළකුණු කිරීම- හග්ගල දැඩි රක්ෂිතය | සම්පූර්ණ කර ඇත. | 59.0 |
| 5 | නාම පුවරු නැවත ස්ථාපිත කිරීම-උණගොල්ල බීට්ටු කාර්යාලය-වික්ටෝරියා රන්දෙනිගල රන්ටැඹේ අභයභූමිය | නාම පුවරු 5 ස්ථාපනය කර ඇත. | 48.0 |
| 6 | නාම පුවරු ප්‍රතිසංස්කරණය-ගැල්වෙස්ලැන්ඩ් ජාතික උද්‍යානය | නාම පුවරු 16 ප්‍රතිසංස්කරණය කරන ලදී. | 25.0 |
| 7 | මායිම් සළකුණු කිරීම-කහල්ල පල්ලෙකැලේ අභයභූමිය | ව්‍යාපෘතිය නවතාදැමූ අතර ප්‍රතිපාදන විල්පත්තුව ජාතික උද්‍යානයේ මායිම් සළකුණු කිරීම සඳහා යොදවන ලදී. | 509.0 |

| | | | |
|---|---|---|---|
| 8 | උතුරු පළාතේ වනජීවී ප්‍රදේශයන්හි නාම පුවරු හා සීමා සළකුණු කිරීම | අනුරාධපුරය කලාපයේ මිහින්තලේ අභයභූමියෙහි නාම පුවරුව සඳහා යොදවන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීය. | 206.0 |
| 9 | මායිම් සළකුණු කිරීම-මාදුගහ අභයභූමිය | අවසන්කර ඇත. | 453.0 |
| 10 | දැනුවත් කිරීමේ නාම පුවරු- හොරගොල්ල ජාතික උද්‍යානය -කාර්යාලය | අවසන්කර ඇත. | 27.0 |
| 11 | ගැසට් නිවේදනයේ පරිදි හඳුනාගත් මායිම් සළකුණු කිරීම-ගල්ඔය ජාතික උද්‍යානයේ දකුණු මායිම | 97 සීමා කණු ස්ථාපිත කරන ලදී.(කි.මී.6.5) | 428.0 |
| 12 | මායිම් මිනුම්කිරීම හා සළකුණු කිරීම-පානම-කුඩුම්බිගල අභයභූමිය | 129 සීමා කණු ස්ථාපිත කිරීම | 465.0 |
| 13 | නාම පුවරු-උස්සන්ගොඩ ජාතික උද්‍යානය | 100% සම්පූර්ණයි. | 48.0 |
| 14 | නාම පුවරු ප්‍රතිසංස්කරණය-සියළු කලාපයන්හි | • නව රක්ෂිත ප්‍රකාශයට පත්කිරීම සඳහා පරිවර්තන ගාස්තු<br>• නාම පුවරු ස්ථාපනය (හොරගොල්ල ජා.උ12, ශ්‍රී ජයවර්ධනපුර අභයභූමිය 05, බස්නාහිර කලාප කාර්යාලය 01, මාදුගහ අභයභූමිය 01) නව නාම පුවරු 02(දකුණු කලාප කාර්යාලය01,ඌව කලාප කාර්යාලය01,නැගෙනහිර 01,පොළොන්නරුව 01,මධ්‍යම 01) | 393.0 |
| 15 | පුවත්පත් වෙළඳ දැන්වීම් | සම්පූර්ණ කරන ලදී | 103.0 |
| 16 | ගැසට් නිවේදන-හොරොව්පතාන ජාතික උද්‍යානය | සම්පූර්ණ කරන ලදී | 4.0 |
| 17 | නාම පුවරු සැකසීම- හොරොව්පතාන ජාතික උද්‍යානය | 04 සම්පූර්ණ කරන ලදී | 473.0 |
| 18 | නාම පුවරු 05ක් ස්ථාපනය කිරීම-රිටිගල ඇත් අතුරු සෙවන | 5(8'x4'-1, 10'x15,-4) නාම පුවරු සම්පූර්ණයි. | 405.0 |
| 19 | සිතියම්ගත කිරීම-පුබුදුගම ප්‍රදේශය | සම්පූර්ණයි | 4.0 |
| 20 | නාම පුවරු-පරවි දූපත් ජාතික උද්‍යානය සඳහා-බැදීම් ගත ලෙවීම් 2011 | 03 සම්පූර්ණයි | 143.0 |
| 21 | නව වනජීවී කළාප කාර්යාල වෙන්කිරීම(කාර්යාල 11) | 02 සම්පූර්ණයි | 43.0 |
| 22 | ආධාරක තහඩු ලබාදීම-මින්නේරිය,ගිරිතලේ | සම්පූර්ණ කරන ලදී | 2.0 |
| 23 | උසාවි වියදම් | ගෙවීම් සම්පූර්ණ කරන ලදී. | 402.0 |
| 24 | පරිසර දිනය උදෙසා සමරු ඵලකයක් ස්ථාපිත කිරීම | සම්පූර්ණ කරන ලදී | 211.0 |
| 25 | නාම පුවරු-මින්නේරිය අභයභූමිය | සම්පූර්ණ කරන ලදී | 205.0 |
| 26 | හික්කඩුව ජාතික උද්‍යානය ප්‍රතිසංස්කරණය | සම්පූර්ණ කරන ලදී | 44.0 |
| 27 | යාල ජාතික උද්‍යානයේ විකල්ප කඳවුරු බිම් ඉවත් කිරීම | සම්පූර්ණ කරන ලදී | 9.0 |
| | **විවිධ** | | 200.0 |
| | **මුළු එකතුව** | | **7,439.0** |
| | **2105-01: රක්ෂිත ප්‍රදේශයන්හි වාසස්ථාන සුපෝෂණ කටයුතු** | | |
| 28 | වාසස්ථාන කළමනාකරණය-හොරගොල්ල ජාතික උද්‍යානය | හෙක්ටයාර 1.5ක දියපර ඉවත්කර අවසන් කර ඇත. හෙක්ටයාර නව තෘණභූමි සැකසීම. | 89.0 |
| 29 | බෙල්ලන්විල අත්තිඩිය අභයභූමියේ වාසස්ථාන සුපෝෂණය ,ඇකේසියා ඉවත්කිරීම හා තෘණභූමි නඩත්තුව | හෙක්ටයාර 02 සම්පූර්ණයි. | 61.0 |
| 30 | මහ දෙපස එළි පෙහෙළි කිරීම-කුමන ජාතික | 100% සම්පූර්ණයි | 864.0 |

| | | | |
|---|---|---|---|
| | උද්‍යානය | | |
| 31 | අඟඩ සහ සැල්විනියා ඉවත්කිරීම-ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය-කිතුලාන ජලාශ්‍රය | 100% සම්පූර්ණයි | 16.0 |
| 32 | වාසස්ථාන සුපෝෂණය(කි.මී 50-හෙක්ටයාර1)උඩවලව ඇත් අතුරුසෙවන | සම්පූර්ණ කරන ලදී | 202.0 |
| 33 | තෘණභූමි කළමනාකරණය(හෙක්ටයාර 01)- උඩවලව ඇත් අතුරුසෙවන | සම්පූර්ණ කරන ලදී | 70.0 |
| 34 | ලැන්ටානා ඉවත් කිරීම(හෙක්ටයාර 100)- උඩවලව ඇත් අතුරුසෙවන | 100% සම්පූර්ණයි.(හෙක්.12.75 ඉහල ඝනත්වය සහ හෙක්ටයාර 50 පහළ ඝනත්වය) | 969.0 |
| 35 | ගිනිපටි නඩත්තුව-( කි.මී.10)උඩවලව ජාතික උද්‍යානය | කි.මී.10 සම්පූර්ණ කරන ලදී | 683.0 |
| 36 | ලැන්ටානා ඉවත්කල ප්‍රදේශ නඩත්තුව-ලුණුගම්වෙහෙර | සිදුකරමින් පවතී | 466.0 |
| 37 | කලපුඅන්දර ඉවත්කිරීම-තබ්බෝව අභයභූමිය | හෙක්ටයාර 21 සම්පූර්ණ කරන ලදී | 991.0 |
| 38 | වස්ගමුව ජාතික උද්‍යානයේ ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම | 100% සම්පූර්ණයි | 34.0 |
| 39 | යාල ජාතික උද්‍යානයේ ගඳපාන ඉවත්කිරීම | අක්කරයක් තුළ ඉවත්කර ඇත | 15.0 |
| 40 | ජාතික උද්‍යානයන්හි ජල සැපයුම සඳහා මුදල් වෙන්කිරීම | කුමන ජාතික උද්‍යානයට ජලය සැපයීම | 93.0 |
| 41 | ඉයුක්ලිප්ටස් ඉවත්කිරීම-තබ්බෝව අභයභූමිය | 100% සම්පූර්ණයි | 12.0 |
| 42 | වස්ගමුව ජාතික උද්‍යානයේ ගඳපාන ඉවත් කිරීම | 100% සම්පූර්ණයි | 34.0 |
| 43 | පැළ සිටුවීමේ වැඩසටහන-රිග්දිල් ප්‍රදේශය | 100% සම්පූර්ණයි | 30.0 |
| 44 | මග දෙපස ආක්‍රමණශීලී විශේෂ ඉවත්කිරීම | 100% සම්පූර්ණයි | 88.0 |
| | විවිධ | | 50.0 |
| | එකතුව | | 4,767.0 |
| | **මුළු එකතුව** | | **12,297.0** |

## පරිච්ඡේදය 03
## නීති ක්‍රියාත්මක කිරීම් අංශය

### 3.1 ප්‍රධාන කාර්යයන් සහ වගකීම්

- වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත ක්‍රියාත්මක කිරීම.
- වනජීවි රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීම.
- වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ සංශෝධන සිදුකිරීම සහ රෙගුලාසි පිළියෙල කිරීම.
- වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත ක්‍රියාත්මක කිරීම සඳහා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය වෙත අවශ්‍ය උපදේශන සේවා සැපයීම.

### 3.2 කාර්යය සාධනයේ විස්තර

### 3.2.1 වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත ක්‍රියාවට නැංවීම

- **ගෘහාශ්‍රිත අලි ඇතුන් සහ දළ ලියාපදිංචි කිරීම.**

ගෘහාශ්‍රිතව ඉපදෙන අලි පැටවුන් ලියාපදිංචි කිරීම, ඇත්දළ ලියාපදිංචි කිරීම, අලි ඇතුන් සහ ඇත් දල සඳහා බලපත්‍ර වාර්ෂිකව අලුත් කිරීම අනිවාර්ය නීතිමය අවශ්‍යතාවකි.


ඒ අනුව 2012 වර්ෂයේදී අලි ඇතුන් 130 ක් සහ දළ 20 ක් ලියාපදිංචිය අලුත් කිරීම මගින් රු. 68,800.00 ක ආදායමක් ලබා ඇත.

- **වනජීවි අපරාධ විමර්ෂණය**


වනජීවි අපරාධ මැඩලීම සඳහා ක්‍රියාකිරීමේදී සාර්ථක වැටලීම් 651ක් සිදුකිරීමට හැකි වු අතර එම අපරාධකරුවන් උසාවි වෙත ඉදිරිපත් කරන ලදී. උසාවි මගින් වනජීවි අපරාධ සඳහා නියම කරන ලද දඩ මුදල් වලින් රු.24,090,000.00 ක ආදායමක් ලබා ඇත. 2012 වර්ෂය තුළදී සිදුකල වැටලීම්වල ව්‍යාප්තිය වගු අංක 3.1 න්ද වනජීවි අපරාධ වලට උසාවි නියෝග අනුව පනවන ලද දඩමුදල් වලින් 2007 – 2012 දක්වා එක්රැස් කර ගත් ආදායම රූපය 3.1හා 3.2 න් දැක්වේ.

වගුව **3.1:** පවරනලද නඩු සංඛ්‍යාව 2012

| වනජීවී කලාපය | නඩු සංඛ්‍යව |
|---|---|
| අනුරාධපුරය | 57 |
| මධ්‍යම | 21 |
| නැගෙනහිර | 67 |
| මහවැලි | 65 |
| වයඹ | 59 |
| දකුණ | 129 |
| ඌව | 85 |
| බස්නාහිර | 14 |
| වැටලීම් ඒකකය(ප්‍රධාන කාර්යාලය) | 32 |
| **2012 සඳහා මුළු එකතුව** | **529** |




**රූපය 3.1**: පවරන ලද නඩු සංඛ්‍යාව(2008-2012)




**රූපය 3.2**: උසාවි දඩ මුදල් වලින් ලද ආදායම(2008-2012)

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ ආරක්ෂාව සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශය වෙත වෙන්කර දුන් ප්‍රතිපාදන යොදවා නීතිය ක්‍රියාත්මක කිරීමට ආධාරවන සම්පත් වැඩිදියුණු කරන ලදී. ක්‍රියාකාරී සැලසුම් ගත කාර්යයන් වල ප්‍රගතිය වගු අංක 3.2 හි දැක්වේ.

වගුව **3.2:** 2012 වසරේ ක්‍රියාකාරී සැලැස්මේ කටයුතුවල ප්‍රගතිය

| අංකය | ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය රු. ('000) |
|---|---|---|---|
| 1 | නීතිමය කටයුතු සම්බන්ධව ධාරිතා වර්ධනය කිරීම | • මුහුදු ක්ෂීරපායින් සම්බන්ද ගැසට් නිවේදනය මුද්‍රණය කිරීම<br>• ගෘහ ආශ්‍රිත අලි-ඇතුන් ලියාපදිංචි කිරීම සම්බන්ධ ගැසට් නිවේදනය මුද්‍රණය කිරීම<br>• දැනුවත් කිරීමේ වැඩසටහන් 01- ස.අ. (නැගෙනහිර), | 275.0 |
| 2 | උසාවි කටයුතුවල ප්‍රගති සමාලෝචන ක්‍රමයක් හඳුන්වාදීඹ (වනජීවි නීතිය බල ගැන්වීමේ ජාලයට සමගාමීව /SLaWEN) | වනජීවී කාර්ය සංග්‍රහය පිළියෙල කිරීමට සමගාමීව මිරිදිය මත්ස්‍ය විශේෂ හඳුනාගැනීම පිළිබඳව සුචියක් සකස් කිරීම සහ පුහුණු වැඩ සටහනක් පවැත්වීම | 1517.0 |
| 3 | 2012 වසරේ සාර්ක් කලාපීය වනජීවී නීතිය බල ගැන්වීමේ ජාලය පිළිබඳව අන්තර්ජාතික සමුළුවක් පැවත්වීම | සාර්ථකව පවත්වන ලදී | 3765.0 |
| 4 | වනජීවී නීතිය බල ගැන්වීමේ ජාලයේ කටයුතු සම්බන්ධව ධාරිතා වර්ධනය කිරීම | • GPS සම්බන්දව සහ ගිනි අවි භාවිතය පිළිබඳව පුහුණු වැඩ සටහනක් බැගින් පවත්වනු ලැබීය<br>• කුමණ සහ යාල ජා.උ. වල නියන් සමයේ දඩයම් මර්ධනය සඳහා (කුමන, යාල කලාප III) | 444.0 |
| 5 | හග්ගල දැඩි රක්ෂිතයේ අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම | තොරතුරු රැස්කිරීම සඳහා නියමු සමීක්ෂණයක් සිදු කිරීම | 86.0 |
| ***එකතුව*** | | | **6087.0** |

# පරිච්ඡේදය 04
# අලි සංරක්ෂණ අංශය

## 4.1 ප්‍රධාන කාර්යයන් සහ වගකීම්

- ජාතික අලි සංරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- වනඅලි සම්බන්ධ දත්ත හා තොරතුරු එකතුව කළමනාකරණය කිරීම සහ යාවත්කාලීන කිරීම.
- වනඅලි මංපෙත් සහිතව වනඅලි සංරක්ෂණ ප්‍රදේශ ස්ථාපිත කිරීම.
- වනඅලි හානි සඳහා වන්දි ගෙවීම.
- ජනාවාස තුළ වනඅලින්ගේ සංචරනයට බාධක වන පරිදි විදුලි වැට, ජීවවැට සහ වෙනත් නවීන ක්‍රමවේද මඟින් භෞතික බාධක ස්ථාපිත කිරීම.
- වනඅලි අල්ලා ඉවත් කිරීම.
- වනඅලි පලවා හැරීම් සංවිධානය, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.
- වනඅලි කළමනාකරණ කටයුතු සඳහා අවශ්‍ය වන භාණ්ඩ මිලදී ගැනීම.

**කාර්ය සාධනයේ විස්තරය**

## 4.2 අලි මිනිස් ගැටුම

භූමි පරිහරණ රටාවේ වෙනස්වීම් සහ භාවිතා කළ හැකි වාසස්ථානවල ගුණාත්මකභාවය පිරිහීම හේතු කොට ගෙන ප්‍රශස්ථ ගුණාත්මකභාවයකින් යුතු වාසස්ථාන අඩුවීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වනඅලි ගහනය එහි පැවැත්මට ඇති තීරණාත්මක බාධාවලට මුහුණ දෙමින් සිටී. මේ හේතුව නිසා මිනිසා සමඟ ඇතිවන ගැටුමෙන් පාර්ශව දෙකටම හානිවන අතර මිනිස් මරණ, වනඅලි මරණ, ශාරීරික හානි සහ දේපළවලට සිදුවන හානි මේ අතුරින් ප්‍රමුඛය. වනඅලි මිනිස් ගැටුම නිසා ප්‍රතිඵල වන වනඅලි මරණ, මිනිස් මරණ, ශාරීරික හානි සහ දේපළ හානි වගුව 4.1, 4.2, 4.3, 4.4, 451, 4.6, සහ 4.7 න් දැක්වේ.

**වගුව 4.1:** කලාපීය අලි මරණ ව්‍යාප්තිය 2008-2012

| වනජීවී කලාපය | වාර්ෂික අලි මරණ සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|
| | **2008** | **2009** | **2010** | **2011** | **2012** | එකතුව |
| **අනුරාධපුරය | - | - | - | - | 19 | 19 |
| මධ්‍යම | 4 | 3 | 2 | 3 | 5 | 17 |
| නැගෙනහිර | 23 | 41 | 42 | 33 | 47 | 186 |
| වයඹ | 92 | 66 | 66 | 82 | 66 | 372 |
| පොළොන්නරුව | 65 | 72 | 74 | 90 | 72 | 373 |
| දකුණ | 30 | 30 | 35 | 36 | 22 | 153 |
| *ඌව | - | - | - | - | 19 | 19 |
| යාල බූන්දල | 10 | 16 | 8 | 11 | - | 45 |
| එකතුව | 224 | **228** | **227** | **255** | 250 | 1,184 |

*නව කලාප පිහිටුවීම -2012 ජූනි
**නව කලාප කාර්යාල පිහිටුවීම - 2012 අගෝස්තු

**වගුව 4.2:** කලාපීය අලි මරණ වර්ගීකරණය 2012

| වනජීවී කලාපය | පිරිමි | ගැහැණු | ළදරු | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|
| **අනුරාධපුරය | 14 | 4 | - | - | 19 |
| මධ්‍යම | 3 | 0 | 1 | 1 | 5 |
| නැගෙනහිර | 30 | 17 | - | - | 47 |
| වයඹ | 30 | 26 | 1 | 9 | 66 |
| පොළොන්නරුව | 39 | 29 | - | 4 | 72 |
| දකුණ | 12 | 5 | - | 3 | 22 |
| *ඌව | 13 | 3 | - | 3 | 19 |
| එකතුව | 141 | 84 | 2 | 21 | 250 |

**වගුව 4.3:** අලි මරණ සඳහා හේතූන් 2012

| වනජීවී කලාපය | මරණ සඳහා හේතු | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ගිනි අවි | විදුලිය වැදීම | විෂ | හක්කපටස් | දුම්රිය අනතුරු | හදුනාගත නොහැකි | අනතුරු | ස්වාභාවික | වෙනත් හේතූන් | එකතුව |
| **අනුරාධපුරය | 2 | 2 | 0 | 5 | 2 | 2 | 5 | 0 | 1 | 19 |
| මධ්‍යම | 2 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 0 | 1 | 5 |
| නැගෙනහිර | 14 | 4 | 2 | 6 | 0 | 12 | 2 | 6 | 1 | 47 |
| වයඹ | 17 | 5 | 3 | 12 | 3 | 15 | 4 | 2 | 5 | 66 |
| පොළොන්නරුව | 13 | 7 | 0 | 16 | 5 | 23 | 3 | 4 | 1 | 72 |
| දකුණ | 1 | 2 | 1 | 0 | 0 | 15 | 2 | _ | 1 | 22 |
| *ඌව | 1 | 1 | 0 | 0 | 0 | 11 | 2 | 3 | 1 | 19 |
| එකතුව | **50** | **21** | **6** | **39** | **10** | **80** | **18** | **15** | **11** | **250** |

**වගුව 4.4:** අලි ප්‍රහාර හේතුවෙන් සිදුවූ වාර්ෂික මිනිස් මරණ 2012

| වනජීවී කලාපය | 2008 | 2009 | 2010 | 2011 | 2012 | එකතුව |
|---|---|---|---|---|---|---|
| **අනුරාධපුරය | – | – | – | – | 12 | 12 |
| මධ්‍යම | 3 | 3 | 4 | 6 | 0 | 16 |
| නැගෙනහිර | 9 | 10 | 14 | 5 | 18 | 56 |
| මහවැලි | 16 | 14 | 14 | 22 | 20 | 86 |
| වයඹ | 33 | 19 | 34 | 20 | 20 | 126 |
| දකුණ | 8 | 3 | 9 | 6 | 7 | 33 |
| *ඌව | – | – | – | – | 1 | 1 |
| යාල බූන්දල | 2 | 1 | 6 | 1 | 1 | 11 |
| එකතුව | **71** | **50** | **81** | **60** | **79** | **341** |

වගුව **4.5:** අලි ප්‍රහාර හේතුවෙන් සිදුවූ වාර්ෂික මිනිස් මරණ වර්ගීකරණය 2012

| වර්ෂය | පිරිමි (වැඩිහිටි) | ගැහැණු (වැඩිහිටි) | ළමා | එකතුව |
|---|---|---|---|---|
| 2008 | 57 | 13 | 1 | 71 |
| 2009 | 43 | 7 | 0 | 50 |
| 2010 | 64 | 16 | 1 | 81 |
| 2011 | 50 | 10 | 0 | 60 |
| 2012 | 64 | 13 | 2 | 79 |
| **එකතුව** | 278 | 59 | 4 | 341 |

වගුව **4.6:** වන අලි ප්‍රහාර හේතුවෙන් මිනිසුන්ට සිදුවූ හානි වල ව්‍යාප්තිය -2012

| වනජීවී කලාපය | වාර්ෂික හානි සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|
| | **2008** | **2009** | **2010** | **2011** | **2012** | **එකතුව** |
| අනුරාධපුරය | - | - | - | - | 0 | 0 |
| මධ්‍යම | 0 | 0 | 4 | 1 | 0 | 5 |
| නැගෙනහිර | 11 | 5 | 8 | 7 | 15 | 46 |
| මහවැලි | 10 | 22 | 27 | 21 | 16 | 96 |
| වයඹ | 38 | 12 | 37 | 25 | 27 | 139 |
| ඌව | - | - | - | - | 0 | 0 |
| යාල-බුන්දල | 4 | 1 | 3 | 0 | 2 | 10 |
| **එකතුව** | 63 | 40 | 83 | 55 | 60 | 301 |

වගුව **4.7:** දේපල හානි ව්‍යාප්තිය (2008-2012)

| වනජීවී කලාපය | වාර්ෂික දේපල හානි | | | | | |
|---|---|---|---|---|---|---|
| | **2008** | **2009** | **2010** | **2011** | **2012** | **එකතුව** |
| **අනුරාධපුරය | – | – | – | – | 58 | 58 |
| මධ්‍යම | 35 | 40 | 64 | 81 | 26 | 246 |
| නැගෙනහිර | 53 | 155 | 266 | 304 | 267 | 1045 |
| මහවැලි | 180 | 230 | 670 | 469 | 429 | 1978 |
| වයඹ | 233 | 203 | 812 | 247 | 2269 | 3764 |
| දකුණ | 138 | 131 | 145 | 124 | 108 | 646 |
| ඌව | – | – | – | – | 21 | 21 |
| යාල-බුන්දල | 45 | 68 | 40 | 0 | 5 | 158 |
| **Total** | 684 | 827 | 1997 | 1225 | 3183 | 7916 |

### 4.2.1. වනඅලි මිනිස් ගැටුම මැඩලීම

වනඅලි මිනිස් ගැටුම මැඩලීම සඳහා වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාකාරීව තීරණාත්මකව කාර්යයභාර්යක් ඉටුකරයි. මේ සඳහා ජාතික වනඅලි සංරක්ෂණ ප්‍රතිපත්තිය මගින් නිර්දේශ කර ඇති විවිධ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම මුලික වශයෙන් සිදුකෙරේ. මෙහිදී ප්‍රධාන වශයෙන් විදුලි වැට ඉදිකිරීම, වනඅලි මෙහෙයුම්, අලිවෙඩි බෙදාදීම වනඅලින් සඳහා වාසස්ථාන සුපෝෂණය සහ වනඅලින්ගේ වාසස්ථාන අතර සම්බන්ධතාවය ස්ථාපිත කිරීම ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. 2008 වර්ෂයේ සිට මෙම ක්රියාකාරකම් සමූහය ඒකරාශී කරගත් සංයුක්ත සැලැස්මක් ක්‍රියාවට නැංවීම සඳහා ගජමිතුරෝ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

### 4.2.2. ගජමිතුරෝ වැඩසටහන

ගජමිතුරෝ ව්‍යාපෘතිය සැලසුම් කරන ලද්දේ සහ ක්‍රියාත්මක කරන ලද්දේ වනඅලි මිනිස් ගැටුමෙන් පීඩාවටපත් දිස්ත්‍රික්ක 18 ක් තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 58ක් තුළ වනඅලි මිනිස් ගැටුම මැඩලීමය. ගජමිතුරෝ ව්‍යාපෘතිය යටතේ විදුලිවැට ඉදිකිරීම වනඅලි පාලන ඒකක 15ක් ස්ථාපනය කිරීම, අලිවෙඩි මිලදී ගැනීම හා බෙදාහැරීම, වනඅලින්ගෙන් සිදුවන හානි සඳහා වන්දි ගෙවීම සහ ක්ෂේත්‍ර වාහන මිලදී ගැනීම යන කරුණු කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදෙන ලදී.

ගජමිතුරෝ වැඩසටහන වනාහි සහභාගිත්ව කළමනාකරණ ක්‍රමවේදයක් ගුරුකොට ගත් ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය මගින් ග්‍රාමීය මට්ටමේ මෙන්ම ජාතික මට්ටමේ ආයතනවල සහ පුද්ගලයින්ගේ සහභාගිත්වය සහ දායකත්වය ලබාගැනීමට අපේක්ෂිතය. පහතින් දැක්වෙනුයේ ගජමිතුරෝ ක්‍රියාකාරී කමිටුවේ සංවිධාන ව්‍යුහයයි. මෙම සංවිධානාත්මක ව්‍යුහය මගින් ගනු ලබන ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා තීරණ ක්‍රියාත්මක කිරීම උදෙසා 2012 වර්ෂය තුළදී භාවිතා කිරීමට රුපියල් මිලියන 200ක ප්‍රතිපාදන ලබාදී ඇත.

ජාතික මෙහෙයුම් කමිටුව

↓

දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව
(අලි මිනිස් ගැටුම පවතින දිස්ත්‍රික්ක සඳහා කමිටුව බැගින් පත් කරනු ලැබේ. දිස්ත්‍රික්ක 18 කි.)

↓

ගජමිතුරෝ කාර්ය සාධන බලකාය
(අලි මිනිස් ගැටුම පවතින ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුල ඇති කරනු ලැබේ.
ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 58කි.)

↓

ක්‍රියාකාරී කමිටුව
(අලි මිනිස් ගැටුම පවතින ග්‍රාම නිලධාරී වසමකට එක් කමිටුවක් බැගින් පත් කරනු ලැබේ.)

වගුව **4.8:**ගජමිතුරෝ වැඩසටහනේ ප්‍රගතිය

| අනු අංකය | ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය රු. ('000) |
|---|---|---|---|
| 1 | විදුලි වැට ඉදිකිරීම | කි.මී 377.60 | 133,746 |
| 2 | පරිපාලන/ විදුලි වැට සඳහා වූ කම්කරුවන් | සම්පූර්ණයි | 17,739 |
| 3 | ඇස්තමේන්තුව අලි පාලන ඒකකය | සම්පූර්ණයි | 4,500 |
| 4 | 2011 බැදීම - මඩකලපුව අලි පාලන ඒකකයේ ඉතිරිව තිබූ කාර්යයන් සඳහා | සම්පූර්ණයි | 3,108 |
| 5 | 2011 බැදීම- ලුණුගම්වෙහෙර දියමණ්කඩ ඉතිරිව තිබූ කාර්යයන් සඳහා | සම්පූර්ණයි | 950 |
| 6 | 2011 බැදීම - රාජ්‍ය ඉංජිනේරු නීතිගත සංස්ථාව සඳහා බිල්පත් ගෙවීම් | සම්පූර්ණයි | 14,074 |
| 7 | අලින් මගින් වූ අනතුරු සඳහා | ගෙවීම් සකසමින් පවතී | 632 |
| 8 | මාර්ග බාධක ඉදිකිරීම, යටි රෝපණය ඉවත්කිරීම, ඉදිකිරීම්(බොරළු අතුරා මාර්ගය ඉදිකිරීම-රිටිගල ඇත් අතුරුසෙවන | සම්පූර්ණයි | 317 |
| | **එකතුව** | | **177.6** |

## 4.2.3. විදුලි වැට ඉදිකිරීම

විදුලි වැට වනඅලින්ගේ සංචරන කටයුතු වලට භෞතික බාධකයක් ලෙස 1966 සිට ශ්‍රී ලංකාව තුළ භාවිතා වේ. අදවන විට වනඅලි මිනිස් ගැටුම මැඩලීම සඳහා යොදාගනු ලබන ප්‍රධානතම මෙවලම වන්නේ විදුලි වැට ඉදිකිරීමයි.

2012 වර්ෂයේ ගජමිතුරෝ වැඩ සටහන යටතේ කි.මී.377.6 දුරකට විදුලි වැට ඉදිකර ඇත. මෙයට අමතරව දැනට ඉදිකර ඇති විදුලි වැටවල් වල අවශ්‍ය කරන ප්‍රතිසංස්කරණ කටයුතු සහ අලුත්වැඩියා කටයුතු ද ගජමිතුරෝ වැඩසටහන යටතේ 2012 වර්ෂය තුළදී සිදුකරන ලදී.

වගුව **4.9:** 2012 වර්ෂයේ දී ඉදිකරන ලද නව විදුලි වැටවල්

| විදුලි වැටේ නම | විදුලි වැටේ දිග (කි.මී.) |
|---|---|
| ඉහකුළුවැව කටුකැලියාව | 12.00 |
| මනම්පිටිය කටුවන්විල විදුලි වැට | 8.00 |
| දියකැපිල්ල ගමවටා | 5.75 |
| එරියාව ගම්මානය වටා විදුලි වැට ඉදිකිරීම | 5.60 |
| කහල්ල කරවිලගල | 12.00 |
| වැලිගත්ත විදුලි වැට | 20.00 |
| පියංහල උන්නච්චි | 40.00 |
| උඩවලව ද්විත්ව විදුලි වැට | 18.00 |
| පුල්ලුමලේ කෝපාවේලි | 23.00 |
| තෙරිපැහැ වික්ටෝරියා | 25.00 |
| කලාවැව | 6.50 |
| කොහොඹදිගාන | 2.00 |
| දෙමට පැලැස්ස | 4.00 |

| | |
|---|---|
| හුංගමල ඔය | 2.00 |
| සීගිරිය | 3.00 |
| මිනිපේ බුලත්වැල්කදුර | 5.50 |
| හුණුවිලගම, බෝගොඩ | 39.50 |
| **එකතුව** | 231.85 |

### 4.2.4. 2012 වර්ෂය තුළදී අලිවෙඩි බෙදාදීම

වනඅලින් පලවා හැරීම සඳහා විශේෂයෙන් සැලසුම් කරන ලද ගිගුම් වෙඩි සහ සංඥා වෙඩි යන වර්ග දෙකෙන් තොග වශයෙන් මිලදී ගන්නා ලද අලිවෙඩි වනඅලි මිනිස් ගැටුම පවත්නා ප්‍රදේශවල වනජීවී කාර්යාල වෙත ලබාදෙන ලදී. වනඅලි මිනිස් ගැටුමේ බලපෑමට ලක්වූ ගම්වැසියන්ට එම ප්‍රදේශවල වනජීවී කාර්යාලවලින් මෙම වෙඩි ලබාගැනීමට පහසුකම් සපයා ඇත. වාර්ෂිකව මිලදීගත් අලිවෙඩි සංඛ්‍යාවන් වගුව 4.10 න්ද ඒවා බෙදාදුන් ආකාරය වගුව 4.11න්ද නිරූපණය කෙරේ.

**වගුව 4.10:** ගිගුම් වෙඩි සහ සංඥා වෙඩි මිලදී ගැනීම-2012

| වර්ගය | මිලදී ගත් සංඛ්‍යාව | වියදම (රු) |
|---|---|---|
| ගිගුම් වෙඩි (ලොකු) | 239,000 | 20,013,000.00 |
| ගිගුම් වෙඩි (කුඩා) | 125,000 | 7,962,825.00 |
| සංඥා වෙඩි | 150,00 | 15,488,200.00 |
| **එකතුව** | **514,000** | **43,464,025.00** |

**වගුව 4.11:** 2012 වර්ෂය තුළ ගිගුම් වෙඩි සහ සංඥා වෙඩි බෙදාහැරීම

| වනජීවී කලාපය | ගිගුම් වෙඩි | | සංඥා වෙඩි |
|---|---|---|---|
| | කුඩා | ලොකු | |
| අනුරාධපුරය | 31,500 | 51,000 | 33,000 |
| මධ්‍යම | 10,500 | 14,000 | 9,000 |
| නැගෙනහිර | 28,650 | 53,500 | 29,800 |
| වයඹ | 14,000 | 23,800 | 17,160 |
| පොළොන්නරුව | 33,300 | 41,400 | 29,600 |
| දකුණ | 17,300 | 34,500 | 23,000 |
| ඌව | 7,450 | 13,000 | 8,500 |
| **එකතුව** | **142,700** | **231,200** | **150,060** |

### 4.2.5. වනඅලි හානි සඳහා වන්දි ගෙවීමේ වැඩසටහන

වනඅලින්ගෙන් සිදුවන ආර්ථික හානි ප්‍රතිපූර්ණය කරගැනීමට සහ ජීවිතහානි නිසා පීඩාවට පත්වන්නන්ගේ පවුලේ සාමාජිකයන්ට සහනයක් වශයෙන් වන්දිගෙවීම අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කරන ලද ක්‍රමවේදයක් අනුව සිදුකරනු ලැබේ. 2012 වර්ෂය තුළදී වන්දි ගෙවීම් පිළිබඳ තොරතුරු වගුව 4.12 හා 4.13 හි දැක්වේ.

වගුව **4.12:** වන්දි ගෙවීම් -2012 ජනවාරි සිට අගෝස්තු දක්වා

| කලාපය | මිනිස් මරණ | | ශාරීරික හානි | | දේපල හානි | |
|---|---|---|---|---|---|---|
| | සිදුවීම් සංඛ්‍යාව | ගෙවීම් (රු.මිලියන) | සිදුවීම් සංඛ්‍යාව | ගෙවීම් රු.මිලියන) | සිදුවීම් සංඛ්‍යාව | ගෙවීම් (රු.මිලියන) |
| මධ්‍යම | 1 | 0.1 | - | - | 22 | 0.22 |
| නැගෙනහිර | 3 | 0.3 | 11 | 0.150 | 212 | 3.50 |
| මහවැලි | 13 | 1.3 | 12 | 0.200 | 295 | 6.13 |
| වයඹ | 14 | 1.4 | 26 | 0.414 | 2262 | 5.06 |
| දකුණ | 10 | 1.0 | - | - | 92 | 1.57 |
| යාල | 1 | 0.1 | 2 | 0.006 | 5 | 0.09 |
| **එකතුව** | 42 | 4.20 | 51 | 0.77 | 2888 | 16.57 |

ගෙවන ලද මුළු වන්දි මුදල රු. මිලියන 21.54

වගුව **4.13:** වන්දි ගෙවීම් -2012 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා

| කලාපය | මිනිස් මරණ | | ශාරීරික හානි | | දේපල හානි | |
|---|---|---|---|---|---|---|
| | සිදුවීම් සංඛ්‍යාව | ගෙවීම් (රු.මිලියන) | සිදුවීම් සංඛ්‍යාව | ගෙවීම් (රු.මිලියන) | සිදුවීම් සංඛ්‍යාව | ගෙවීම් (රු.මිලියන) |
| අනුරාධපුරය | 8 | 0.8 | - | - | 58 | 1.57 |
| මධ්‍යම | - | - | - | - | 4 | 0.07 |
| නැගෙනහිර | 10 | 1.0 | 4 | 0.05 | 55 | 0.93 |
| වයඹ | 3 | 0.3 | 1 | 0.002 | 7 | 0.108 |
| පොළොන්නරුව | 7 | 0.7 | 1 | 0.07 | 134 | 2.18 |
| දකුණ | 2 | 0.2 | - | - | 16 | 0.21 |
| ත්‍රිකුණාමලය | 1 | 0.1 | - | - | - | - |
| ඌව | 1 | 0.1 | - | - | 21 | 0.38 |
| **එකතුව** | 32 | 3.2 | 6 | 0.122 | 295 | 5.448 |

ගෙවන ලද මුළු වන්දි මුදල රු. මිලියන 8.77
(2012 දෙසැම්බර් 31 වන විට)

## 4.2.6 කරදරකාරී වනඅලින් අල්ලා ඉවත් කිරීම - 2012 වර්ෂය

ගැටුම්කාරී වනඅලින් 16 ක් අල්ලා කුමන සහ මාදුරුඔය ජාතික උද්‍යාන වෙත නිදහස් කරන ලදී. මේ සඳහා වනජීවී සංරක්ෂණ අරමුදලින් ප්‍රතිපාදන යොදා ගන්නා ලදී.

වගුව **4.14:** කරදරකාරී වන අලින් අල්ලා ඉවත් කිරීම– 2012

| වනජීවී කලාපය | අල්ලා ඉවත්කළ වන අලින් | වියදම(රු.) |
|---|---|---|
| අනුරාධපුරය | 06 | 2,970,427.00 |
| මධ්‍යම | 02 | 666,821.00 |
| නැගෙනහිර | 01 | 215,000.00 |
| පොළොන්නරුව | 03 | 861,006.00 |
| දකුණ | 04 | 1,512,480.00 |
| **එකතුව** | **16** | **6,225,734.00** |

### 4.2.7. වන අලි පලවා හැරීම - 2012

වනඅලි මිනිස් ගැටුම පවතිනා ප්‍රදේශ වලින් එම අලින් රක්ෂිත ප්‍රදේශයන් තුළට පළවා හැරීම සිදුකෙරේ. 2012 වර්ෂය තුළ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සංවිධානාත්මක වනඅලි පළවා හැරීම් 8ක් සිදුකර ඇත.එම වනඅලි පළවා හැරීම් පිළිබඳව තොරතුරු වගුව 4.15 දැක්වේ.

වගුව **4.15:** වන අලි පලවා හැරීම – 2012

| කලාපය | ස්ථානය | පළවා හරින ලද වනඅලින් සංඛ්‍යාව |
|---|---|---|
| මධ්‍යම | වික්ටෝරියා රන්දෙනිගල රන්ටැඹේ-මොරන්ගහතැන්න,වැලිහිද | 10 |
| | මාදුරුඔයජාතික උද්‍යානය-දඹරව,මාපකාවවැව | 14 |
| වයඹ | අමුණුකුල-ගිරිබාව | 85 |
| | තබ්බෝව-පුත්තලම,මයිලන්කුලම | 70 |
| | ඉගිනිමිටිය- නිකවැරටිය,කොටවෙහෙර | 73 |
| | තබ්බෝව- නිකවැරටිය,රම්බකනායගම | 60 |
| | තබ්බෝව-කරුවලගස්වැව | 25 |
| පොළොන්නරුව | ඇලහැර-මාතලේ,හතමුණගල | 16 |
| **වන අලි පලවා හැරීම් සංඛ්‍යාව 2012** | | 351 |

### 4.2.8. දැයට කිරුළ ජාතික සංවර්ධන ව්‍යාපෘතිය

වගුව **4.16:** දැයට කිරුළ ක්‍රියාකාරකම් - 2012

| අනු අංකය | ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය රු. ('000) |
|---|---|---|---|
| 1 | විදුලි වැට ඉදිකිරීම(හුණුවිල-බෝගොඩ-මල්වතුඔය) | විදුලි කුටි ඉදිකර ඇත. කි.මී.39.5ක් දුරට විදුලි වැට ඉදිකර ඇත. | 32,374 |

# පරිච්ඡේදය 05
# පර්යේෂණ හා පුහුණු අංශය

## 5.1 ප්‍රධාන කාර්යයන් සහ වගකීම්

- වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා පර්යේෂණ හා පුහුණු සැලසුම් සැකසීම හා ඒවායෙ ඇස්තමේන්තු පිළියෙල කිරීම.
- දෙපාර්තමේන්තු පර්යේෂණ කමිටුව යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය පුස්තකාලය පවත්වාගෙන යාම.
- පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සහ පැවැත්වීම.
- ජාතික වනජීවි පුහුණු හා පර්යේෂණ කේන්ද්‍රය අධීක්ෂණය කිරීම.

## 5.2 පර්යේෂණ කටයුතු

වනජීවි සංරක්ෂණයට අදාලව තෝරාගන්නා ලද කෙටිකාලීන පර්යේෂණ ව්‍යාපෘති සඳහා වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව එහි නිලධාරීන් වෙත ප්‍රතිපාදන ලබාදේ. මෙසේ සිදුකරන ලද පර්යේෂණ වල ප්‍රතිඵල වනජීවි සංරක්ෂණ කටයුතු සඳහා දායක කරගැනීමට තරම් ඉහළ වැදගත්කමකින් යුක්ත බව හඳුනාගෙන ඇත.

එයට අමරතව වනජීවි සංරක්ෂණයට අදාල ව්‍යාපෘති රක්ෂිත ප්‍රදේශ ජාලය තුළ හෝ ඉන් පිටත සිදුකිරීම සඳහා වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව අවසර ලබාදේ. මෙම අවස්ථාව බහුලවම භාවිතා කරනු ලබන්නේ බාහිර පර්යේෂණ ආයතන සහ පර්යේෂකයන් විසිනි. කෙසේ නමුත් මෙම පර්යේෂණ සඳහා දෙපාර්තමේන්තු පර්යේෂණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය අවශ්‍යතාවකි.

වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය මගින් 2012 වර්ෂයේදී සිදුකරන ලද පර්යේෂණ ලැයිස්තුව වගුව 5.1 න්ද එම වර්ෂය තුළදීම වෙනත් ආයතන සමඟ සිදුකල ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති වගුව 5.2 හිද දැක්වේ.

**වගුව 5.1:** වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් භාරගත් පර්යේෂණ අධ්‍යානයන් -2012

| අනු අංකය | පර්යේෂණ මාතෘකාව |
|---|---|
| 1 | අවම වියදමක් හා ශක්තියක් යෙදවීම මගින් විදුලි වැට සැකසීම |
| 2 | සංචාරක වැඩි දියුණු කිරීම සහ වනජීවි කළමනාකරණය සඳහා භූගෝලීය තොරතුරු පද්ධතිය යොදා ගැනීම |
| 3 | වන අලින් අතර පවතින ක්ෂයරෝගය අධ්‍යයනය කිරීම |
| 4 | පරවි දූපත් ජාතික උද්‍යානයේ පවතින කොරල් හඳුනාගැනීම |
| 5 | මින්නේරිය ජාතික උද්‍යානය තුළ සිටිනා කුරන් අධ්‍යයනය කිරීම |
| 6 | වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව තුළ පවතින සාර්ථක හා අසාර්ථක නීති ක්‍රියාත්මක කිරීම් පිළිබඳව හඳුනාගැනීම |
| 7 | හග්ගල දැඩි රක්ෂිතය තුළ ඕකිඩ් විශේෂ හඳුනාගැනීම |
| 8 | නිළ බල ක්‍රමය මත පදනම්ව වනජීවී සංරක්ෂන දෙපාර්තමේන්තු උප සංස්කෘතිය වෙත වනජීවී ක්ෂේත්‍ර නිලධාරීන් නිවැරදිව සමාජානුයෝජනය වී ඇත්දැයි විමසීමේ විමර්ශනාත්මක ව්‍යාපෘතිය |
| 9 | විල්පත්තු ජාතික උද්‍යානයේ ගගේ වාඩිය ප්‍රදේශයෙහි කඩොලාන විශේෂ හඳුනාගැනීම |

වගුව **5.2:** සහයෝගීතා පර්යේෂණ වැඩසටහන් - 2012

| අනු අංකය | පර්යේෂණ මාතෘකාව | සම්බන්ධීකරණ ආයතන |
|---|---|---|
| 01 | ජාතික පක්ෂි මුදු පැළඳවීමේ වැඩසටහන බුන්දල ජාතික උද්‍යානය | ශ්‍රී ලංකා ක්ෂේත්‍ර පක්ෂි විද්‍යා කණ්ඩායම |

## 5.3 පුහුණු කටයුතු

වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය සඳහා ක්‍රියාත්මක කරනු ලබන පුහුණු වැඩසටහන් ප්‍රධාන වර්ග දෙකකි.

1.කෙටිකාලීන විශේෂ පුහුණු වැඩසටහන්
2. නිත්‍ය පුහුණු වැඩසටහන්

මෙයට අමතරව ලැබෙන අවස්ථාවන් අනුව විදේශීය පුහුණු අවස්ථාද වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත ලබා දේ.

### 1. කෙටිකාලීන විශේෂ පුහුණු වැඩසටහන්

මෙම කෙටිකාලීන පුහුණු වැඩසටහන් වල මූලික අරමුණ වන්නේ කාර්යමණ්ඩලයේ දැනුම් හා කුසලතා පරාසය වැඩි කිරීමයි. මෙම සෑම වැඩසටහනක්ම පාහේ තෝරා ගන්නා ලද පුහුණු කිරීම් ආයතන හෝ සංවිධාන සමඟ ඒකාබද්ධව සිදුකෙරේ. 2012 වර්ෂය තුළදී පවත්වන ලද එවැනි වැඩසටහන් වල විස්තරයක් වගුව 5.3 හි දැක්වේ.

වගුව **5.3:** 2012 වර්ෂය තුළ පවත්වන ලද වනජීවි නිලධාරීන් සඳහා කෙටිකාලීන විශේෂ පුහුණු වැඩසටහන්

| අනු අංකය | පුහුණු වැඩසටහනේ මාතෘකාව | සහභාගී වූ සංඛ්‍යාව | ඉලක්කගත කාණ්ඩය | වියදම(රු '000') |
|---|---|---|---|---|
| 1 | බෝට්ටු පැදවීම හා නඩත්තුව | 15 | RA, WG | 111,621.00 |
| 2 | දෙමළ භාෂාව- 1මට්ටම | 25 | RA, WG, MFA, MA | නොමිලේ |
| 3 | GPS පුහුණු | 30 | R, RA, WG | 52,350.00 |
| 4 | බංගලා භාරකරුවන් පුහුණුව | 15 | BK,PL | 66,058.00 |
| 5 | වනඅලි සඳහා කරපටි පැළඳවීම | 28 | R, RA, WG | 85,142.00 |
| 6 | වන අධ්‍යනය සහ පරිසර කළමණාකරනය- පශ්චාත් විද්‍යා උපාධිය | 01 | DD | 120,000.00 |
| 7 | පුරා ජෛව විද්‍යාව පිළිබඳ පාඨමාලාව | 02 | | නොමිලේ |
| 8 | දුම්රිය දෙපාර්තමේන්තු නිළධාරීන් සඳහා පුහුණු වැඩමුළුව | 70 | දුම්රිය දෙපාර්තමේන්තු නිළධාරීන් | 63,00.00 |
| 9 | ගිනි අවි හැසිරවීම සහ ක්ෂේත්‍ර මෙහෙයුම් | 48 | R, RA, WG | 400,241.00 |
| 10 | වනජීවී නිළධාරීන් සඳහා ,ආකල්ප වෙනස් කිරීම සහ ධනාත්මක චින්තනය පිළිබඳව වැඩසටහන | 35 | R, RA, WG | |
| 11 | උසාවි කටයුතු | 25 | R, RA, WG | 101,800.00 |
| මුළු වියදම | | | | **1,000,212.00** |

R - වනසත්ව අඩවි ආරක්ෂක
RA - අඩවි සහකාර
WG - වනජීවි නියාමක
DD - නියෝජ්‍ය අධ්‍යක්ෂ
MFA - කළමනාකරන හා මූල්‍ය සහකාර
MA - කළමනාකරන සහකාර
BK - බංගලා භාරකරුවන්
PL - ස්ථිර කම්කරුවන්

මීට අමතරව ජාතික වනජීවී පුහුණු කේන්ද්‍රය, ගිරිතලේ මඟින් පහත සඳහන් කෙටි කාලීන පුහුණු පාඨමාලාද පවත්වන ලදී. විස්තර 5.4 වගුවේ දැක්වේ.

වගුව **5.4:** 2012 වර්ෂය තුළ ජාතික වනජීවී පුහුණු කේන්ද්‍රයහි පවත්වන ලද කෙටිකාලීන පුහුණු වැඩසටහන්

| අනු අංකය | පුහුණු වැඩ සටහනේ මාතෘකාව | ඇස්තමේන්තුව | වියදම (රු.) |
|---|---|---|---|
| 1 | දුම්රිය නිළධාරීන් සඳහා පුහුණු වැඩසටහන | 29,325.00 | 26,756.00 |
| 2 | සිතියම් කියවීම සහ GPS පුහුණු වැඩසටහන | 52,350.00 | 46,611.00 |
| 3 | දුම්රිය නිළධාරීන් සඳහා පුහුණු වැඩසටහන | 34,150.00 | 33,421.00 |
| 4 | වනජීවී කාර්ය සංග්‍රහයෙහි අඩංගු මිරිදිය මසුන්ගේ සුචිය පිළිබඳව හඳුනාගැනීමේ | 43,000.00 | 42,511.00 |
| 5 | දුම්රිය නිළධාරීන් සඳහා පුහුණු වැඩසටහන | 34,650.00 | 34,603.50 |
| 6 | වනඅලි කළමණාකරනය පිළිබඳව කළමනාකරණ සහකාරවරුන් සඳහා පුහුණු වැඩසටහන | 100,000.00 | 85,681.50 |
| 7 | නව වනජීවී නියාමකවරු උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන | 350,000.00 | 301,144.80 |
| 8 | GPS පුහුණුව | 103,400.00 | 94,929.00 |
| 9 | වාසස්ථාන සුපෝෂණය | 38,600.00 | 38,456.00 |
| එකතුව | | **785,475.00** | **704,113.80** |

## 2. නිත්‍ය පුහුණු වැඩසටහන්

ගිරිතලේ පිහිටි වනජීවි පුහුණු හා පර්යේෂණ ආයතනය විසින් වනජිවි සංරක්ෂණ දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය සඳහා නිත්‍ය පුහුණු පාඨමාලා පවත්වනු ලැබේ. එසේ 2012 වර්ෂය තුළදී පවත්වන ලද නිත්‍ය පුහුණු පාඨමාලාවල විස්තරයක් වගුව 5.5 හි දැක්වේ.

වගුව **5.5:** 2012 වසරේ ජාතික වනජීවී පුහුණු කේන්ද්‍රය පවත්වන ලද විධිමත් පුහුණු වැඩසටහන්

| පුහුණු පාඨමාලා | විස්තරය | වියදම (රු.'000') |
|---|---|---|
| වනජීවි කළමනාකරණ ප්‍රාථමික සහතිකපත්‍ර පාඨමාලාව | XXIX(කණ්ඩායම) වනජිවි නියාමක | 639 |
| වනජීවි කළමනාකරණ ඩිප්ලෝමා | VII කණ්ඩායම් 01 | 1,708 |
| එකතුව | | **2,**347 |

- **අන්තර්ජාතික පුහුණු**

පහත දැක්වෙන විදේශීය පුහුණු අවස්ථා වනජිවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලයේ තෝරාගන්නා ලද සාමාජිකයින් කීපදෙනෙකුට ලබාදෙන ලදී.

වගුව **5.6:** 2012 වර්ෂය තුළ වනජීවි නිලධාරීන් සහභාගි වු ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්

| අනු අංකය | පුහුණු පාඨමාලා | සහභාගිවන්නන්ගේ සංඛ්‍යාව හා තනතුර | රට | කාලසීමාව |
|---|---|---|---|---|
| 1 | තෙත් බිම් කළමණාකරුවන්ගේ තොරතුරු හුවමාරු කිරීම හා පුහුණු වැඩ සටහන් | නියෝජ්‍ය අධ්‍යක්ෂ(සැළසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ)/වන අඩවි නියාමක iii සහභාගීවූවන් සංඛ්‍යාව - 02 | දකුණු කොරියාව | දින 5 |
| 2 | අධ්‍යන චාරිකා | නියෝජ්‍ය අධ්‍යක්ෂ(නීති ක්‍රියාත්මක කිරීම),ස.අධ්‍යක්ෂ(NWTC), ස.අධ්‍යක්ෂ(අලි සංරක්ෂණ),වන සත්ව සහකාර-21/සහභාගීවූවන් සංඛ්‍යාව - 24 | ඉන්දියාව | දින 12 |

## 5.5 ව්‍යාප්ති, අධ්‍යාපන හා විවරණ කටයුතු

සංරක්ෂණය බහුවිධ පාර්ශවයන්ගේ දායකත්වය සහ ආශිර්වාදය රහිතව සාර්ථක කර ගැනීම උගහටය.එබැවින් සංරක්ෂණ කටයුතු සඳහා හොඳින් දැනුවත් වු ජනතාවක් සිටීම සහ ඒ අයගේ දායකත්වය අතිශය වැදගත්ය.

පාසැල් ළමුන්, ග්‍රාමීය ජනතාව සහ රජයේ සේවකයින් යන ඉලක්කගත කණ්ඩායම් සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාප්ති, අධ්‍යාපන සහ විවරණ වැඩසටහන් පිළිබද විස්තරයක් වගුව 5.7 හි දැක්වේ.

වගුව **5.7:** 2012 වසරේ පවත්වන ලද සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ දැනුවත්කිරීමේ වැඩසටහන්

| අනු අංකය | ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය රු.'000 |
|---|---|---|---|
| 1. | ලෝක තෙත්බිම් දිනය වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන | වැඩසටහන් 04ක් පවත්වන ලදී.(ඌව-01,බස්නාහිර-01,වයඹ-01,නැගෙනහිර-01) | 154.0 |
| 2. | ලෝක ජෛව විවිධත්ව දිනය(මහවැලි හා මධ්‍යම කලාප) | වැඩසටහන් 07ක් පවත්වන ලදී.(ඌව-01,බස්නාහිර-01,වයඹ-01,නැගෙනහිර-02,දකුණ-01,පොළොන්නරුව-01) | 241.0 |
| 3. | ලෝක පරිසර දිනය වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන | වැඩසටහන් 04ක් පවත්වන ලදී.(මධ්‍යම-01,දකුණ-01,මහවැලි-01,බස්නාහිර-01,නැගෙනහිර-01) | 172.0 |
| 4. | පොසොන් උත්සවය වෙනුවෙන් විශේෂ දැනුවත් කිරීම-මිහින්තලේ සහ සිතුල්පව්ව | වැඩසටහන් 01 ක් පවත්වන ලදී. (ඌව) | 111.0 |
| 5. | දකුණු කලාපයේ ඇසළ උත්සවය | කතරගම වැඩසටහනක් සිදුකරන ලදී. | 87.0 |
| 6. | පාසැල් ළමුන් සඳහා වනජීවි සංරක්ෂණය පිළිබද සම්මන්ත්‍රණ-වැඩසටහන් 10 බැගින් | පවත්වන ලද වැඩසටහන් - සහකාර අධ්‍යක්ෂ (බස්නාහිර)-10, සහකාර අධ්‍යක්ෂ (නැගෙනහිර)-10, සහකාර අධ්‍යක්ෂ (මධ්‍යම)-10, සහකාර අධ්‍යක්ෂ (අනුරාධපුරය)-10, සහකාර අධ්‍යක්ෂ (දකුණ)-10, සහකාර අධ්‍යක්ෂ (පොළොන්නරුව)-10, සහකාර අධ්‍යක්ෂ (වයඹ)-10 | 439.0 |
| 7. | සියලු කලාපවල රාජ්‍ය නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් (එක කලාපයකට 02 බැගින්) | වැඩසටහන් 01 ක් පවත්වන ලදී. .( ස. අධ්‍යක්ෂ (බස්නාහිර)-02, ස.අධ්‍යක්ෂ (නැගෙනහිර)-02, සහකාර අධ්‍යක්ෂ (මධ්‍යම)-02, සහකාර අධ්‍යක්ෂ (අනුරාධපුරය)-01, සහකාර අධ්‍යක්ෂ (දකුණ)-02, ස. අධ්‍යක්ෂ (පොළොන්නරුව)-02, | 302.0 |

| | | | |
|---|---|---|---|
| 8. | ඉල්ලීම් මත දැනුවත් කිරීමේ වැඩසටහන් හා විශේෂ සම්මන්ත්‍රණ/ප්‍රදර්ශන | වැඩසටහන් 11 ක් පවත්වන ලදී<br>- ස. අධ්‍යක්ෂ (බස්නාහිර)-02, ස. අධ්‍යක්ෂ (නැගෙනහිර)-06, ස. අධ්‍යක්ෂ (මධ්‍යම)-01, ස. අධ්‍යක්ෂ (දකුණ)-05, ස.අධ්‍යක්ෂ (යාල බුන්දල)-01, ස. අධ්‍යක්ෂ (වයඹ)-04 | 163.0 |
| 9. | විවරණ පුවරු-කුමන සහ ගල්ඔය ජාතික උද්‍යාන සඳහා | සම්පූර්ණ කරන ලදී. | 176.0 |
| 10. | ප්‍රචාරණ කටයුතු | මාධ්‍ය 38ක් දැනුවත් කිරීමේ වැඩසටහන් 01ක් පවත්වන ලදී. | 76.0 |
| 11. | අධ්‍යාපන දැන්වීම් පත්‍රිකා සහ අත් පත්‍රිකා මුද්‍රණය | පිටපත් 5,000ක් මුද්‍රණය කිරීම | |
| 12. | වාර්තාගත වැඩසටහන් නිෂ්පාදනය | | |
| 13. | විශේෂ වැඩසටහන් | • ප්‍රදර්ශන 01<br>• ගොවිජන උද්‍යානය පුවත්පත මුද්‍රණය,<br>• රාජ්‍ය නිළධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක්(කතරගම),<br>• පාසල් සිසුන් (අනුරාධපුරය)-01,<br>• කිඹුලන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 02(දකුණ)<br>විවරණ පුවරු-කුමන සහ ගල්ඔය ජාතික උද්‍යාන සඳහා, රූපවාහිනී වැඩසටහන් 04 ක් මිළදී ගැනීම - ස.අ. (නැගෙනහිර) - 01<br>• වනජීවී සඟරාව මුද්‍රණය- පිටපත් 2,500<br>• අත් පත්‍රිකා 20,000 මුද්‍රණය-දැයට කිරුළ | 870.0 |
| 14. | වනන්තරේ කතන්දරේ වාර්තාගත ගුවන්විදුලි වැඩසටහන සඳහා ගෙවීම් | සම්පූර්ණ කරන ලදී. | 383.0 |
| 15. | දිවියන් ඇල්ලීමේ වීදුරු ආවරණය සැකසීම-මින්නේරිය ජාතික උද්‍යානය | සම්පූර්ණ කරන ලදී. | 16.0 |
| | විවිධ | | |
| | **එකතුව** | | **3,190** |

## 5.6 දෙපාර්තමේන්තු ප්‍රකාශන

පහත දැක්වෙන ප්‍රකාශ (වගුව 5.8) 2012 වර්ෂයේදී මුද්‍රණය කරන ලද අතර ඒවා අතරින් පෝස්ටර් විකිණීම සඳහා ජාතික උද්‍යාන කාර්යාල වෙතද අනෙකුත් ප්‍රකාශන අදාල නිලධාරීන් සහ කාර්යාල වෙතද නිකුත් කරන ලදී.

**වගුව 5.8:** 2012 වසරේ ප්‍රචාරණ

| ප්‍රචාරණ මාධ්‍යය | පිටපත් සංඛ්‍යාව | වියදම (රු. '000') |
|---|---|---|
| වාර්ෂික වනජීවී සඟරාව | 2,500 | 305.0 |
| අත්පත්‍රිකා 'වනදිවි සම්පත් රැකගැනීමට' | 20,000 | 85.0 |
| වනන්තරේ කතන්දරේ (ගුවන් විදුලි වැඩසටහන) | 4 | 140.0 |
| වාර්තාගත විඩියෝ කිරීමේ වැඩසටහන් | 4 | 14.0 |
| ගොවිජන උද්‍යානය පුවත්පත | 10 | 47.0 |
| වනජීවී කාල සටහන | 10,000 | 69.0 |
| **මුළු වියදම** | | **660.0** |

## 5.7 වෙනත් කටයුතු

- **අන්තර්ජාතික සම්මුතීන්**

ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති පරිසර සංරක්ෂණයට අදාල සම්මුති කීපයක් සඳහා අධිකාරිමය බලය වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.

1. CITES - සම්මුතිය යනු අන්තර්ජාතිකව රාජ්‍යයන් අතර ඇති කර ගන්නා ගිවිසුමකි. මෙමගින් අන්තරායට ලක්වූ වනජ ශාක හා සතුන් විශේෂ යොදාගෙන සිදුකරන අන්තර්ජාතික වෙළදාම යාමනය කිරීම සිදුකරනු ලැබේ. එමගින් එම විශේෂවල ස්වභාවික පැවැත්ම ආරක්ෂා කිරීම අපේක්ෂාවයි.

වගුව **5.9:** නිකුත් කරන ලද CITES බලපත්‍ර සංඛ්‍යාව (2007-2012)

| වසර | නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව | ආදායම (රු. '000') |
|---|---|---|
| 2007 | 768 | 384.0 |
| 2008 | 781 | 390.5 |
| 2009 | 764 | 382.0 |
| 2010 | 685 | 342.5 |
| 2011 | 596 | 522.0 |
| 2012 | 722 | 491.8 |

2. CMS or Bonn සම්මුතිය - මෙමගින් ගොඩබිමින් මුහුදු මගින් පියැඹීම මගින් පර්යටනය කරනු ලබන විශේෂවල ආරක්ෂාව එම විශේෂවල සම්පූර්ණ හැසිරීම් කලාපය තුළ තහවුරු කිරීම අපේක්ෂා කරනු ලැබේ.

3. රම්සා සම්මුතිය - මෙම සම්මුතිය මගින් අන්තර්ජාතිකව සාමාජික රාජ්‍යයන් විසින් තම දේශසීමා තුළ පවතින අන්තර්ජාතික වශයෙන් වැදගත් වන තෙත්බිම් සංරක්ෂණය කිරීම මගින් එම තෙත් බිම්වල සහ ඒවා භාවිතා කරන පර්යටන පක්ෂී විශේෂවල සංරක්ෂණය අපේක්ෂා කෙරේ.

මේ අනුව බලන කල අන්තර්ජාතික වශයෙන් සංරක්ෂණය කෙරෙහි ඉතාම වැදගත් වන මෙම සම්මුතීන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාකරනවා මෙන්ම එම සම්මුති වලට අදාල ජාතික සහ අන්තර්ජාතික මට්ටමේ රැස්වීම්, සම්මේලන, වැඩමුළු ආදියටද ක්‍රියාකාරී සහභාගිත්වයක් ලබාදේ.

වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් ඉහත සම්මුතීන්ට අදාලව පහත දැක්වෙන අන්තර්ජාතික රැස්වීම් වැඩමුළු සහ සම්මේලන යනාදියට සහභාගිවන ලදී.

**වගුව 5.10:** 2012 වසරේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නියෝජනය කල ජාත්‍යන්තර රැස්වීම් සහ වැඩමුළු

| අනු අංකය | වැඩමුළු හා රැස්වීම් | සහභාගිවන්නන් | රට | කාලය |
|---|---|---|---|---|
| 01 | ජපානයේ සත්ව උද්‍යානවල අලි- ඇතුන් රැකබලා ගැනීමේ ක්‍රමවේදයේ යෝග්‍යතාවය ඇගයීම | නියෝජ අධ්‍යක්ෂ (වනජීවී සෞඛ්‍ය) | ජපානය | දින 08 |
| 02 | ටාමා සත්ව උද්‍යානයේ අලි- ඇතුන් රැකබලා ගැනීමේ ක්‍රමවේදයේ යෝග්‍යතාවය ඇගයීම | නියෝජ අධ්‍යක්ෂ (වනජීවී සෞඛ්‍ය) | ජපානය | දින 08 |
| 03 | පශු වෛද්‍ය වැඩමුළුව - ආසියා කලාපීය අලි ඇතුන් සම්බන්ධව | නියෝජ අධ්‍යක්ෂ (වනජීවී සෞඛ්‍ය) | ඉන්දුනීසියා | දින 05 |
| 04 | අන්තර්ජාතික රම්සා සම්මුතිය ක්‍රියාවට නැන්වීම පිළිබඳව තාක්ෂණික සහ විද්‍යාත්මක සහයෝගිතාවය පිළිබඳ කලාපීය වැඩමුළුව | නියෝජ අධ්‍යක්ෂ (සැලසුම් හා තො.ස.තා) | දකුණු කොරියාව | දින 03 |
| 05 | දකුණු ආසියානු ඖෂද පැලැටි පිළිබඳ වැඩමුළුව | සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා පුහුණු) | භූතාන | දින 03 |
| 06 | ඉන්දියන් සාගර කලාපයේ මුහුදු ආරක්ෂිත ප්‍රදේශ ජාලය කළමණාකරණය කිරිම | සහකාර අධ්‍යක්ෂ (වයඹ) | තායිලන්තය | දින 04 |
| 07 | සංවර්ධනය වෙමින් පවතින රටවල ස්වාභාව රක්ෂිත කළමණාකරණය සහ ආරක්ෂා කිරිම පිළිබඳව සමුළුව | සහකාර අධ්‍යක්ෂ (ස්වාභාවික සම්පත්) | චීනය | දින 04 |
| 08 | සතුන්ගෙන් මිනිසුන්ට බෝවන රෝග වැළැක්වීම හා මර්ධනය කිරිම තුන්වන කලාපීය සමුළුව | පශු වෛද්‍ය නිලධාරි | ඉන්දුනීසියාව | දින 02 |
| 09 | කුරුළු උණ සම්බන්ධ වැඩමුළුව | පශු වෛද්‍ය නිලධාරි | නේපාලය | දින 02 |
| 10 | පැරා සත්වෝද්‍යානයේ අලින් නඩත්තු කිරිම පිළිදව යෝග්‍යතාවය ඇගයීම | පශු වෛද්‍ය නිලධාරි | මහජන චෙක් රාජ්‍ය | දින 09 |
| 11 | ටෙහෙරාන් සත්වෝද්‍යානයේ අලින් නඩත්තු කිරිම පිළිදව යෝග්‍යතාවය ඇගයීම | පශු වෛද්‍ය නිලධාරි | ඉරානය | දින 04 |
| 12 | IUCN අන්තර්ජාතික සම්මේලනය | අධ්‍යාපන හා පුහුණු නිලධාරි | දකුණු කොරියාව | දින 14 |
| 13 | කඩොලාන නැවත වගා කිරම සම්බන්දයෙන් අධ්‍යාන සම්මේලනය | වනසත්ව අඩවි ආරක්ෂක 1 | ඉන්දියාව | දින 05 |

| | | | | |
|---|---|---|---|---|
| 14 | BOBLME – SEAFDEC – FAQ කලාපීය වැඩමුළුව | වනසත්ව අඩවි ආරක්ෂක | තායිලන්ඩ් | දින 04 |

## 5.8. දැයට කිරුළ ජාතික සංවර්ධන ව්‍යාපෘතිය

**වගුව 5.11:** දැයට කිරුළ ක්‍රියාකාරකම් -2012

| **අනු අංකය** | **ක්‍රියාකාරකම** | **භෞතික ප්‍රගතිය** | **මූල්‍ය ප්‍රගතිය රු. ('000)** |
|---|---|---|---|
| 1 | 2012- දැයට කිරුළ ප්‍රදර්ශණය | සාර්ථකව පවත්වන ලදී | 1,311.0 |

# පරිච්ඡේදය 6
# පාරිසරික සංචාරක සේවා හා ජනවිහිදුම්කරණ අංශය

## 6.1 ප්‍රධාන කාර්යයන් සහ වගකීම්

- සංචාරක සේවා සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම.
- නව සංචාරක පැකේජ හඳුන්වාදීම.
- සංචාරක කටයුතු විවිධාංගීකරණය
- සංචාරක සේවා සහ පාරිසරික සංචාරක කටයුතු අලෙවිකරණය සහ ප්‍රවර්ධනය
- රක්ෂිත ප්‍රදේශ තුළ සහ ඒ ආශ්‍රිතව සංචාරක සේවා තොරතුරු මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
- රක්ෂිත ප්‍රදේශ මත අවට ප්‍රජාවගේ යැපීම අඩු කිරීම සඳහා එම ප්‍රජාවන් රක්ෂිත ප්‍රදේශ කළමනාකරණය සඳහා දායක කර ගැනීම.
- අධ්‍යාපනික සහ ව්‍යාප්ති වැඩසටහන් මගින් මහජනතාව සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම.

### 6.1.1 කාර්යයසාධනයේ විස්තර


#### 6.1.1.1 සංචාරකයින් සහ ආදායම

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ජාතික උද්‍යාන ආශ්‍රිතව සපයනු ලබන සංචාරක සේවා මගින් එහි ආදායමින් වැඩි කොටසක් උපයයි. 2012 වර්ෂයේදී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සංචාරක සේවා මගින් උපයන ලද මුදල රු. 701,059,366.74 (වගුව 6.1)

**වගුව 6.1:** සංචාරක සේවාවන්හි වාර්ෂික ආදායම

| අංකය | ස්ථානය | ආදායම (රු.) |
|---|---|---|
| 01 | උඩවලව ඇත් අතුරු සෙවන | 6,952,355.00 |
| 02 | යාල - පලටුපාන | 342,585,737.12 |
| 03 | යාල - කටගමුව | 7,784,823.54 |
| 04 | යාල - ගල්ගේ | 94,818.72 |
| 05 | බූන්දල | 9,574,461.03 |
| 06 | හෝර්ටන් තැන්න | 121,242,329.26 |
| 07 | උඩවලව | 69,619,071.71 |
| 08 | විල්පත්තුව | 25,903,702.36 |
| 09 | වස්ගමුව | 6,138,549.71 |
| 10. | මින්නේරිය | 65,552,337.79 |
| 11 | ලුණුගම්වෙහෙර - තණමල්විල | 2,261,342.98 |
| 12 | ලුණුගම්වෙහෙර-ගල්ගේ | 150,796.80 |
| 13 | ලුණුගම්වෙහෙර - කරවිල | 45,627.98 |
| 14 | කවුඩුල්ල | 18,041,018.80 |
| 15 | හොරගොල්ල | 273,745.52 |
| 16 | මාදුරුඔය | 273,794.24 |
| 17 | කුමන - ඕකන්ද | 6,282,484.16 |
| 18 | ගල්ඔය | 1,563,081.52 |
| 19 | ගල්ඔය - නීලගල පිවිසුම | 70,296.80 |
| 20 | අම්පාර - එග්ගල්ඔය බංගලාව | 136,080.00 |
| 21 | අන්ගම් මඩිල්ල | 313,895.28 |
| 22 | ගැල්වේයිස්ලෑන්ඩ් | 181,852.00 |
| 23 | ගිරිතගේ | 287,710.00 |
| 24 | මදුනාගල බීට්ටු කාර්යාලය | 0.00 |

| | | |
|---|---|---|
| 25 | ලාහුගල | 174,232.96 |
| 26 | පරවි දූපත | 15,035,986.88 |
| 27 | හික්කඩුව | 406,012.50 |
| 28 | රිටිගල | 4840.09 |
| 29 | මිහින්තලේ (කාර්ය මණ්ඩල නැවතුම) | 20,328.00 |
| 30 | කතරගම (කාර්ය මණ්ඩල නැවතුම) | 64,988.00 |
| 31 | නල්ලතන්නිය | 23,066.00 |
| | **ආදායම** | **701,059,366.74** |





**රූපය 6.1:** සංචාරක සේවාවන්හි වාර්ෂික ආදායම (2004-2012)


**වගුව 6.2:** සංචාරකයින් වර්ගීකරණය

| ජාතික උද්‍යානය | පැමිණීම | | |
|---|---|---|---|
| | දේශීය | විදේශීය | මුළු පැමිණීම |
| යාල | 217,898 | 121,735 | 339,633 |
| හෝර්ටන් තැන්න | 184,744 | 39,123 | 223,867 |
| උඩවලව | 52,995 | 23,082 | 76,077 |
| වස්ගමුව | 22,891 | 812 | 23,703 |
| මින්නේරිය | 37,833 | 25,020 | 62,853 |
| බූන්දල | 6,397 | 4,853 | 11,250 |
| හොරගොල්ල | 6,637 | 2 | 6,639 |
| කවුඩුල්ල | 8,930 | 6,443 | 15,373 |
| ලුණුගම්වෙහෙර | 3,115 | 48 | 3,163 |
| ගල්ඔය | 2,523 | 332 | 2,855 |
| කුමන | 18,644 | 1,958 | 20,602 |
| අංගම්මැඩිල්ල | 1,536 | 0 | 1,536 |
| ගැල්වේස්ලෑන්ඩ් | 1,521 | 82 | 1,603 |


| | | | |
|---|---|---|---|
| විල්පත්තුව | 29,689 | 5,417 | 35,106 |
| මාදුරුඔය | 716 | 21 | 737 |
| ලාහුගල | 314 | 110 | 424 |
| පරවි දූපත | 36,646 | 8,437 | 45,083 |
| හික්කඩුව | 40,506 | 7,050 | 47,556 |
| ඇත් අතුරු සෙවන | 106,176 | 9,527 | 115,703 |
| **මුළු සංඛ්‍යාව** | **779,711** | **254,052** | **1,033,763** |




**රූපය 6.2 :** 2012 වසරේ සංචාරක කණ්ඩායම් බෙදී යන ආකාරය




**රූපය 6.3:** 2012 වසරේ සංචාරක ව්‍යාප්තිය




**රූපය 6.4:** 2012 වසරේ සංචාරක පැමිණීම 1995-2012

### 6.1.1.2 ස්වේච්ඡා මාර්ගෝපදේශකයින්

ජාතික උද්‍යාන ආශ්‍රිතව සිදුකරන සංචාරක සේවා කටයුතු වලදී ස්වේච්ඡා මාර්ගෝපදේශකයින් ලෙස රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත ප්‍රජාවන්ගෙන් තොරා ගන්නා ලද උගත් තරුණ තරුණියන් යොදා ගැනීමේ ක්‍රියාවලියක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරයි. මෙම ස්වේච්ඡා මාර්ගෝපදේශකයින් ජාතික උද්‍යාන ආශ්‍රිතව විවරණ කටයුතු සඳහා යොදවා ගනු ලැබේ. 2008 සිට 2012 දක්වා කාලය තුළදී සේවයෙහි යොදවා ගන්නා ලද ස්වේච්ඡා මාර්ගෝපදේශකයින් සංඛ්‍යාවන් පහත දැක්වේ.

**වගුව 6.3:** ස්වේච්ඡා මාර්ගෝපදේශකයින් සංඛ්‍යාව 2008-2012

| **වර්ෂය** | **ස්වේච්ඡා මාර්ගෝපදේශකයන් සංඛ්‍යාව** |
|---|---|
| 2007 | 197 |
| 2008 | 189 |
| 2009 | 266 |
| 2010 | 255 |
| 2011 | 285 |
| 2012 | 323 |

වගුව **6.4:** ජාතික උද්‍යානවල සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීමට ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම් - 2012

| අනු අංකය | ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.000) |
|---|---|---|---|
| 1 | කව්ඩුල්ල ජාතික උද්‍යානය-දොරදෙක ඇල සහ සුදුගල කඳවුරු බිම් 2ක් ඉදිකිරීම | 01 කඳවුරක් සම්පූර්ණ කර ඇත. | 270.0 |
| 2 | තංගමලේ අභයභූමිය-කසල භාජන ස්ථාපිත කිරීම | 100% සම්පූර්ණ කර ඇත. | 107.0 |
| 3 | රිටිගල දැඩි ස්වභාව රක්ෂිතය-තොරතුරු හා පර්යේෂණ මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය | තීන්ත ආලේපකර ඇති අතර අවසරපත් කුටිය ඉදිකරමින් පවතී. | 785.0 |
| 4 | උස්සන්ගොඩ ජාතික උද්‍යානය-තොරතුරු හා ටිකට්පත් කුටිය ඉදිකිරීම | භූ විද්‍යා දෙපාර්තමේන්තුවේ තත්ව සහතිකය ලැබෙනතුරු මෙම වසර සඳහා මෙම ව්‍යාපෘතිය නවතා ඇත. | - |
| 5 | එක්ගල්ඔය වනජීවී බංගලාව ප්‍රතිසංස්කරණය කිරීම | 100% සම්පූර්ණ කර ඇත. | 1,394.0 |
| 6 | සේනානායක සමුද්‍රයේ බෝට්ටු අංගනය ඉදිකිරීම | සම්පූර්ණ කර ඇත. | 96.0 |
| 7 | කුමන ජාතික උද්‍යානය-කුමන විල්ලුවහි නැරඹුම් අංගනය ඉදිකිරීම | 70% සම්පූර්ණ කර ඇත. | 280.0 |
| 8 | ඒකාබද්ධ ගොඩනැගිලි සංචාරක බංගලා බවට පත් කිරීම | සම්පූර්ණ කර ඇත. | 755.0 |
| 9 | ගල්ඔය ජාතික උද්‍යානය-කොස්සපොළ කඳවුරු බිම් ප්‍රතිසංස්කරණය | 100% සම්පූර්ණ කර ඇත. | 277.0 |
| 10 | ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය-කඳවුරු බිම් 2ක් ඉදිකිරීම | 100% සම්පූර්ණ කර ඇත. | 435.0 |
| 11 | බුන්දල ජාතික උද්‍යානය-ශ්‍රවනාගාරය වටා දැල් ගසා ආවරණය කිරීම | ඇස්තමේන්තුව නැවත සකසමින් පවතී | |
| 12 | පරිවර්තන ද්‍රව්‍ය | හික්කඩුව සහ කුමන ජාතික උද්‍යාන-ඇතුල්වීමේ අවසරපත් 1350ක් මුද්‍රණය | 226.0 |
| 13 | යාල ජාතික උද්‍යානය-පැළ සිටුවීමේ වැඩසටහන් හා බුතව සංචාරක බංගලාව සඳහා සූර්යබල පද්ධතියක් ස්ථාපිත කිරීම | සම්පූර්ණ කර ඇත. | 40.0 |
| 14 | යෝජිත හික්කඩුව සංචාරක මධ්‍යස්ථානය සහ කාර්යාල ගොඩනැග්ල්ල ඉදිකිරීම සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයදුම්පත් ඉදිරිපත් කිරීමේ වියදම | සම්පූර්ණ කර ඇත. | 2.0 |
| 15 | රවී සමරසිංහ අනුස්මරණ මධ්‍යස්ථානය විවෘත කිරීමේ උත්සවය | සම්පූර්ණ කර ඇත. | 53.0 |
| 16 | යාල ජාතික උද්‍යානය- සූර්යබල පද්ධතියක් ස්ථාපිත කිරීමේ උත්සවය සඳහා සහ උස්සන්ගොඩ ජාතික උද්‍යානයේ පැළ සිටුවීමේ වැඩසටහන | සම්පූර්ණ කර ඇත. | 24.0 |
| 17 | සෝමාවතිය,යාල සහ අංගම්මැඩිල්ල ජාතික උද්‍යානයන්හි ඇමතිතුමාගේ ක්ෂේත්‍ර චාරිකා | සම්පූර්ණ කර ඇත. | 53.0 |
| 18 | සංචාරක බංගලා සමීක්ෂණය | 70% සම්පූර්ණ කර ඇත. | 17.0 |
| 19 | යාල සහ විල්පත්තුව ජාතික උද්‍යානයන්හි ස්වේච්ඡා මාර්ගෝපදේශකයින් සංවර්ධනය | වැඩසටහන් 2ක් අවසන් කර ඇත. | 129.0 |
| 20 | විල්පත්තුව ජාතික උද්‍යානය-විලච්චිය සහ තන්තිරිමලේ පිවිසුමෙහි එලකයන් සැකසීම | සම්පූර්ණ කර ඇත. | 144.0 |
| 21 | විල්පත්තුව ජාතික උද්‍යානයේ තලවිල බංගලාව නැවත ඉදිකිරීම පිළිබඳව බවර් සහ සමාගම සමග සාකච්ඡා කිරීම | | 8.0 |
| 22 | වස්ගමුව වනජීවී බංගලාවන්හි ගෘහභාණ්ඩ පිළිසකර කිරීම | සම්පූර්ණ කර ඇත. | 31.0 |
| 23 | මනවිල සංචාරක බංගලාවන්හි වැසිකිළිය පිළිසකර කිරීම | සම්පූර්ණ කර ඇත. | 5.0 |
| 24 | උඩවලව ජාතික උද්‍යානය-තිබ්බිරියමංකඩ | සිදු කරමින් පවතී. | 215.0 |

| | | | |
|---|---|---|---|
| | සංචාරක බංගලාව පිළිසකර කිරීම | (30% සම්පූර්ණ කර ඇත. ) | |
| 25 | මාදුරුඔය ජාතික උද්‍යානය-එදිරටමුල්ල වනජීවී බංගලාවෙහි ජල සැපයුම් පද්ධතිය පිළිසකර කිරීම | ගැඹුරු ළිං වළලු මිළදී ගන්නා ලදී | 17.0 |
| 26 | යාල ජාතික උද්‍යානය-පැරණි බූතව සහ ඔංඩච්චි බංගලා පිළිසකර කිරීම | ස්වෙච්ඡා සේවකයින් මගින් පිරිසිදු කිරීම සිදුකරන ලදී | 141.0 |
| 27 | කුමන ජාතික උද්‍යානය- කැස්බෑ සංරක්ෂණ ව්‍යාපෘතියෙහි පරිවර්තන ද්‍රව්‍ය | ප්‍රතිපාදන මුදාහැර ඇත. | 105.0 |
| 28 | මින්නේරිය ජාතික උද්‍යානය-පරිවර්තන පුවරු වීදුරු ආවරණයෙන් සැකසීම | 100% සම්පූර්ණ කර ඇත. | 16.0 |
| 29 | රිටිගල ඇත් අතුරු සෙවන විවෘත කිරීම | සමරු ඵලක 1 ක් නිෂ්පාදනය කර සවි කරන ලදී. | 91.0 |
| 30 | කුමන ජාතික උද්‍යානය-සංචාරක මධ්‍යස්ථානය සහ සුභ සාධක ආපනශාලාව ප්‍රතිසංස්කරණය කිරීම | 100% සම්පූර්ණ කර ඇත. | 280.0 |
| 31 | දැනුවත් කිරීමේ වැඩසටහන් | 01 මාධ්‍ය වැඩමුළුවක්(ස්වෙච්ඡා සේවකයින්) | 117.0 |
| 32 | කව්ඩුල්ල ජාතික උද්‍යානය-මැණික්සොරොව්ව බංගලාව සඳහා සූර්ය බල පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම | සම්පූර්ණ කර ඇත. | 27.0 |
| | එකතුව | | **6,247.0** |

## 6.2 ජනවිඥුම්කරණ

### 6.2.1 කාර්යසාධනයේ විස්තර

රක්ෂිත ප්‍රදේශ අවට ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික හැකියාවන් වැඩිදියුණු කිරීම තුලින් එම පිරිස් සංරක්ෂණය සඳහා ක්‍රියාකාරීව දායක කර ගැනීමට ජනවිඥුම්කරණ කටයුතු යටතේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එකී වැඩසටහන් පිළිබඳව දත්ත හා තොරතුරු වගුව 6.7 හි දැක්වේ.

**ජනවිඥුම්කරණ මගින් ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති සහ වැඩසටහන් - 2012**
**හෝර්ටන්තැන්න ජාතික උද්‍යානය පිරිසිදු කිරීමේ වැඩසටහන**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රථම වරට පෞද්ගලික අංශයේ සහාය ඇතිව අරඹන ලද ව්‍යාපෘතිය ලෙස HSBC ආයතනයේ අනුග්‍රහය ඇතිව පිරිසුදු කිරීමේ ව්‍යාපෘතියක් 1999දී හෝර්ටන්තැන්න ජාතික උද්‍යානයේදී අරඹන ලදී. ව්‍යාපෘතිය අරඹන අවධියේ එහි ප්‍රධාන අරමුණ වූයේ පොලිතින් නිසා මිය යන මුවන් ප්‍රමාණය අඩු කිරීමට විධිමත් කසළ කළමණාකරණ ක්‍රියාවලියක් ඇරඹීම තුළින් හෝර්ටන්තැන්නෙහි සුන්දරත්වය රැකගැනීමයි. හෝර්ටන්තැන්නෙහි පරිසර පද්ධතිය කසළ සහ පොලිතින් වලින් රැකගැනීම පිණිස ව්‍යාපෘතිය 2012 දක්වා දීර්ඝ කෙරිණි.

මෙම ව්‍යාපෘතිය යටතේ පිරිසිදු කිරීමේ කටයුතු සඳහා අසල දියගම වතුයායෙන් කම්කරුවන් 06දෙනෙකු බඳවා ගත් අතර ඔවුන්ගේ වැටුප් ව්‍යාපෘතිය යටතේ වසර පුරා ගෙවනු ලැබිණි. වනෝද්‍යානයට සැළකිය යුතු සංචාරක ප්‍රගතියක් පෙන්නුම් කළ නිසා භාෂා පරිවර්තකයින් දෙදෙනෙකු වසර 08ක් පුරා සංචාරකයන් දැනුවත් කිරීමට බඳවා ගත් අතර ඔවුන්ගේ වැටුප් මෙම වසරේදීත් ව්‍යාපෘතිය මගින් ගෙවීමට කටයුතු කරන ලදී.
කසල උද්‍යානයෙන් පිටතට ගෙනයාමටත් පිරිසිදු කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීමටත් උද්‍යාන භාරකරු වෙත අත්ට්‍රැක්ටරය හා යතුරු පැදිය සඳහා ඉන්ධන දීමනාවක් ලබාදෙනු ලැබිණි.

මෙම ව්‍යාපෘතිය යටතේ අධ්‍යාපනික දැන්වීම් පුවරු ලෝකාන්තය බේකස් ඇල්ල මාර්ගයේ සවිකරණ ලද අතර හානි සිදුකර තිබූ පුවරු මෙම වසරේදී පිළිසකර කරන ලදී.

**හෝටන්තැන්න ජාතික උද්‍යානයේ ජල පෝෂක ප්‍රදේශයන්හි නැවත වන වගාකිරිමේ ව්‍යාපෘතිය**

හෝටන්තැන්න ජාතික උද්‍යානයේ ජල පෝෂක ප්‍රදේශයන්හි නැවත වන වගාකිරිමේ ව්‍යාපෘතිය 2012 වසරේදී HSBC සමඟ අරම්භ කරනු ලැබීය. මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ හෝටන්තැන්න ජාතික උද්‍යානයේ පේරක කලාපයේ හානියට ලක් වූ ජල පෝෂක ප්‍රදේශවල නැවත වන වගා කිරිමයි. මෙම ව්‍යාපෘතිය දේශීය පරිසර සංවිධාන සමග තේ පර්යේෂණ ආයතනයේ සේවකයන් සහ, අවට තේ වතුවල වතු අධිකාරි වරුන්ගෙන් සමන් විත "හෝටන් තැන්න මිතුරෝ" සහභාගිත්වයෙන් සැලසුම් සකස් කර ඇත.
හානියට පත්වූ ජල පෝෂක ප්‍රදේශයන්ගෙන් ආසන්න වශයෙන් හෙක්ටයාර 1.5ක ප්‍රදේශයක පිහිටි සමර්සෙට් තේ වත්ත නියමු ව්‍යාප්තිය සඳහා තෝරාගන්නා ලදී. මේ සඳහා 1500ක් දේශිය පළතුරු හා වන ශාක 2012 දෙසැම්බර් මස වැසි සමයත් සමඟ රෝපණය කරන ලදී.

වල්පැල ඉවත් කිරීම මියගිය පැළ වෙනුවට නව පැළ සිටුවීම හා පැල වල වර්ධනය නිරීක්ෂණය නොකඩවා සිදුකරනු ලබයි. නැවත වන වගා කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර සමර්සෙට් දෙමළ මහා විද්‍යාලයේ සිසුන් සහ ගුරුවරුන් හට ජන විඥිදුම්කරණ වැඩ සටහනක්, සහකාර අධ්‍යක්ෂක (මධ්‍යම වනජීවී කලාපය) සහ හෝර්ටන්තැන්න ජාතික උද්‍යානයේ භාරකරු සහභාගීත්වයෙන් පවත්වන ලදී.

**සමනල අඩවිය ස්වභාවික රක්ෂිතය පිරිසිදු කිරීම:**

හෝර්ටන් තැන්නට සමානව HSBC ආයතනයේ අනුග්‍රහයෙන් සමනල කන්දහිදීද පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියක් 2007 වසරේදී ඇරඹුණු අතර 2012 දක්වා ක්‍රියාත්මක කෙරිණි.මෙම ව්‍යාපෘතිය යටතේ කම්කරුවන් දෙදෙනෙකු පල්ලබැද්ද ප්‍රදේශයටත් තවත් දෙදෙනෙකු නල්ලතන්නි ප්‍රදේශයටත් කසල එකතු කිරීමට(විශේෂයෙන් පොළිතින් සහ ප්ලාස්ටික්)බඳවා ගැණුනි. කසල පිටතට ගෙනයාම සඳහා උද්‍යාන භාරකරු වෙත මාසික ඉන්ධන දීමනාවක් ලබා දෙන ලදී.

වනෝද්‍යානයේ සංචාරක මාර්ග දෙපස ස්ථිර කසල බඳුන් ස්ථාපිත කොට නොමැති හෙයින් කසල සහ පොළිතින් වනෝද්‍යානය පුරා විසිරී ඇති අතර එය කසල එකතු කිරීමටද බාධාවක් වන අතර වන සතුන් හටද තර්ජනයක්ව පැවතිණ. එම නිසා HSBC ආධාර ඇතිව මූලික වශයෙන් නල්ලතන්නිය මාර්ගයේ ස්ථිර කසල බඳුන් ස්ථාපිත කෙරුණු අතර එම ආකෘතියම හෝර්ටන්තැන්නටද යොදාගත් අතර ඇස්තමේන්තුව අනුව නල්ලතන්නි මාර්ගයේ කසළ බඳුන් 15ක් ඉදිකිරීමට 2012 අග භාගයේදී ඇරඹුණු අතර 2013 වසර මුලදී නිම වීමට නියමිතය.

HSBC **කාර්ය මණ්ඩලය මගින් නියමිත වැඩසටහන – සමනල අඩවිය ස්වභාව රක්ෂිතය**

HSBC ආයතනයේ ඉල්ලීම අනුව කාර්ය මණ්ඩලය මගින් මෙහෙයවූ ව්‍යාපෘතියක් පල්ලෙබැද්ද සහ සමනල අඩවිය ස්වභාව රක්ෂිතය හිදී 2012.10.12 දින ඇරඹිණි.මෙම අවස්ථාවට HSBC කළමණාකරුවන් ඇතුළුව 50 දෙනෙකු සහභාගී වූ අතර උද්‍යාන භාරකරු විසින් සමනල අඩවිය ස්වභාව රක්ෂිතය පිළිබද දේශනයක් ඉදිරිපත් කරන ලදී. එහිදී මෑතකදී ලෝක උරුමයක් ලෙස නම් කෙරුණු උද්‍යානයේ ජෛව විවිධත්ව කේන්ද්‍රයක් ලෙස ඇති වටිනාකම අවධාරණය කෙරිණි.
මෙහිදී HSBC සේවක මණ්ඩලය මගින් පල්ලෙබැද්ද මාර්ගය අවට මං තීරු පිරිසිදු කරන ලදී.

වගුව **6.5:** 2012 වසරේ ජනවිහිදුම්කරණ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

| **අනු අංකය** | **ක්‍රියාකාරකම** | **භෞතික ප්‍රගතිය** | **මූල්‍යමය ප්‍රගතිය රු('000)** |
|---|---|---|---|
| | **2001-3:ආරක්ෂිත කලාප තුල සහ පිටත ජනවිහිදුම්කරණ කටයුතු** | | |
| 1 | වස්ගමුව ජා.උ. අවට ප්‍රජා පාදක සංවිධානවල ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම (ජීව වැටවල් නඩත්තු කිරිම) | ඉදි කිරිම් සම්පූර්ණ කර ඇත | 125.0 |
| 2 | වස්ගමුව ජා.උ. අවට පළතුරු වගා කිරිමේ ව්‍යාපෘතිය | පැළ 1295 ක් පවුල් 50ක් අතර බෙදා හැර ඇත | 159.0 |
| 3 | මින්නේරිය ජා.උ. අවට ප්‍රජා පාදක සංවිධානවල ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම (ජීව වැටවල් නඩත්තු කිරිම) | ඉදි කිරිම් සම්පූර්ණ කර ඇත | 98.0 |
| 4 | මින්නේරිය ජා.උ. අවට ප්‍රජා පාදක සංවිධානවල ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම (ජීව වැටවල් නඩත්තු කිරිම) | ඉදි කිරිම් සම්පූර්ණ කර ඇත | 87.0 |
| 5 | කවුඩුල්ල ජා.උ. අවට ප්‍රජා පාදක සංවිධානවල ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම (දැනුවත් කිරිමේ වැඩසටහන්) | වැඩසටහන් 03 ක් පවත්වා අවසන් කර ඇත | 90.0 |
| 6 | ශ්‍රී පාද අඩවිය අවට ප්‍රජා පාදක සංවිධානවල ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම (ජීව වැටවල් නඩත්තු කිරිම) | ඉදි කිරිම් සම්පූර්ණ කර ඇත | 97.0 |
| 7 | ශ්‍රී පාද අඩවිය අවට ශ්‍රමදාන වැඩ සටහනක් | ඉදි කිරිම් සම්පූර්ණ කර ඇත | 180.0 |
| 8 | අන්ගම්මැඩිල්ල ජා.උ. අවට ජීව වැටවල් ඉදි කිරිම | ඉදි කිරිම් සම්පූර්ණ කර ඇත | 145.0 |
| 9 | කුමණ ජා.උ. අවට පළතුරු වගා කිරිමේ ව්‍යාපෘතිය (1 කොටස) | පැළ 1150 ක් පවුල් 755ක් අතර බෙදා හැර ඇත. | 141.0 |
| 10 | කුමණ ජා.උ. අවට  කඩොලාන වගා කිරිමේ ව්‍යාපෘතිය | පැළ 1,500 ක් සිටුවා අවසන් කර ඇත | 95.0 |
| 11 | කුමණ ජා.උ.  අවට ප්‍රජා පාදක සංවිධානවල ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම (කඩොලාන වගා කිරිමේ ව්‍යාපෘතිය ) | පැළ 1,501 ක් සිටුවා අවසන් කර ඇත | 96.0 |
| 12 | උඩවලව ජා.උ. අවට ප්‍රජා පාදක සංවිධානවල ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම (ශ්‍රමදාන වැඩ සටහන්) | ශ්‍රමදාන වැඩ සටහන් 02ක්  සම්පූර්ණ කර ඇත | 100.0 |
| 13 | බූන්දල ජා.උ. අවට ප්‍රජා පාදක සංවිධානවල ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම (ශ්‍රමදාන වැඩ සටහනක්) | සම්පූර්ණ කර ඇත | 50.0 |
| 14 | බූන්දල ජා.උ. යේ සවිය කාන්තා වැඩසටහන | සම්පූර්ණ කර ඇත | 20.0 |
| 15 | ශ්‍රී පාද අඩවියේ එච්. එස්. බී. සී බැන්කුව සමග ශ්‍රමදාන වැඩ සටහනක් | සම්පූර්ණ කර ඇත | 75.0 |
| 16 | ප්‍රජා පාදක සංවිධාන සඳහා දැනුවත් කිරිමේ වැඩසටහන් | සම්පූර්ණ කර ඇත | 31.0 |
| 17 | පේරක කලාපවල ප්‍රජාවගේ සමාජ සවලතාව සඳහා වැඩසටහන් | සම්පූර්ණ කර ඇත | 51.0 |
| 18 | වස්ගමුව ජා.උ. යේ තාවකාලික  කම්කරුවන්ගේ වැටුප් ගෙවීම | සම්පූර්ණ කර ඇත | 10.0 |
| | **එකතුව** | | **1,650** |

# පරිච්ඡේදය 7
# වනජීවී සෞඛ්‍ය කළමනාකරණ අංශය

## 7.1 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වගකීම්

- වනසතුන්ගේ සෞඛ්‍ය තත්වයන් සහ රෝග තත්වයන් සම්බන්ධව සුපරීක්ෂණය සහ ක්‍රියාකාරී වීම.
- වනසතුන්ගේ පශුවෛද්‍ය ආරක්ෂණය සම්බන්ධව ඵලදායී සහ වේගවත් ප්‍රතිචාර දැක්වීම.
- වනසතුන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීම.
- සුභසාධනය පිළිබඳ සුපරීක්ෂාකාරී වීම සහ ගුණාත්මක බව වර්ධනය කිරීම.
- වනසත්ව මිනිස් ගැටුම් කළමනාකාරීත්වයට දායකවීම.
- වනසත්ව පුනරුත්ථාපන මධ්‍යස්ථාන කළමනාකරණය කිරීම.
- ඇත්අතුරු සෙවන කළමනාකරණය කිරීම.

## 7.2 2011 වර්ෂයේ කාර්ය සාධනය

- **වනසතුන්ට ප්‍රතිකාර කිරීම**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත පශුවෛද්‍යවරුන් විසින් වර්ෂය පුරාම වනසතුන්ට ප්‍රතිකාර කිරීමෙහි නියැලුණි. වර්තමානයේ වනජීවී සංරක්ෂණයේදී වනඅලින් සඳහා ප්‍රතිකාර කිරීමට ප්‍රමුඛතාවක් දෙන අතර 2012 වර්ෂයේදී ක්‍රියාවට නංවන ලද වනඅලින්ට ප්‍රතිකාර කිරීම පිළිබඳව විස්තර සංඛ්‍යාත්මකව දත්ත වගුව 7.1 හි දැක්වේ.

**වගුව 7.1:** 2012 වසරේ වන සතුන්ට ප්‍රතිකාර කිරීම

| වනජීවී කලාපය | අලින් සංඛ්‍යාව | අනෙකුත් සතුන් සංඛ්‍යාව |
|---|---|---|
| මධ්‍යම | 08 | 40 |
| නැගෙනහිර | 24 | 50 |
| මහවැලි | 36 | 24 |
| වයඹ | 84 | 24 |
| දකුණ | 36 | 120 |
| බස්නාහිර | - | 220 |
| **එකතුව** | **188** | **438** |

- **පශ්චාත් මරණ පරීක්ෂණ**

දෙපාර්තමේන්තුවේ පශුවෛද්‍ය නිලධාරීන් විසින් සිදු කරන ලද වනඅලි ප්‍රමුඛ වනසතුන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ 7.2 වගුවේ දැක්වේ. මෙම පශ්චාත් මරණ පරීක්ෂණ වසංගත රෝග විනිශ්චය සහ වනසතුන්ගේ සෞඛ්‍ය කටයුතු පවත්වාගෙන යාම සඳහා ඉතාම වැදගත්ය.

වගුව **7.2**: 2012 වසරේ වන සතුන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ

| වනජීවී කලාපය | පශ්චාත් මරණ පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|
| මධ්‍යම | 05 |
| නැගෙනහිර | 24 |
| මහවැලි | 22 |
| වයඹ | 48 |
| දකුණ | 18 |
| බස්නාහිර | 09 |
| **එකතුව** | **126** |

- **වනඅලින් කළමනාකරණය**

කරදරකාරී වනඅලින් අල්ලා ඉවත් කිරීම, පරීක්ෂණ සඳහා එම සතුන් වෙත කරපටීන් පැළඳවීම යන කටයුතු සඳහා මෙම අංශය ප්‍රමුඛ රාජකාරි ප්‍රමාණයක් ඉටුකරයි. මෙම කටයුතු වනඅලි මිනිස් ගැටුම මැඩලීම සඳහා ඉතාමත් වැදගත්ය.

උඩවලව ඇත්අතුරු සෙවනේ රැකබලා ගන්නා ලද අනාථ වූ අලිපැටවුන් 08 දෙනෙකු උඩවලව, මාදුරුඔය හා කුමන ජාතික උද්‍යාන තුළට නිදහස් කරන ලදී.

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ කලාපීය වශයෙන් දායකත්වය දැක්වූ ක්‍රියාකාරකම් 7.3 වගුවේ දැක්වේ.

වගුව **7.3:** 2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

| අනු අංකය | ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය රු.('000) |
|---|---|---|---|
| | **2001-4:අන්තරායට ලක්වූ ජීවී විශේෂ සංරක්ෂණය** | | |
| 1 | කැස්බෑ සංරක්ෂණය-කුමන ජාතික උද්‍යානය | 100% සම්පූර්ණයි (01 ගොඩනැගිල්ලක් සහ බිත්තර දමනා ස්ථාන සංවර්ධනය) | 244 |
| 2 | කැස්බෑ සංරක්ෂණය-හික්කඩුව ජාතික උද්‍යානය | සම්පූර්ණයි(බිත්තර දමනා ස්ථාන සංවර්ධනය සහ අඩි 48 දිගට වැට ගැසීම) | 98 |
| 3 | උඩවලව ඇත් අතුරු සෙවන වටා කම්බි වැට ප්‍රතිසංස්කරණය | 600m දිගට වැට සාදා නිම කරන ලදී | 301 |
| 4 | ඇත් අතුරු සෙවන වටා මුර කුටි 04ක් ඉදිකිරීම | 1 මුර කුටියක් ඉදිකර අවසන් කර ඇත. | 221 |
| 5 | **වෙනත්** | | 561 |
| 6 | අතුරුගිරිය ප්‍රදේශයේ මුවන් ජාතික උද්‍යානයකට මුදා හැරීම | PVC කම්බි දැල්,යකඩ බට 20යොදා කුඩු 11ක් සෑදීම | 801 |

| | | | |
|---|---|---|---|
| 7 | කිඹුලන් සඳහා උපකරණ මිළදී ගැනීම | සිදුකරමින් පවතී. | 9 |
| 8 | තාවකාලික සත්ව රැඳවුම් කූඩු සැකසීම | PVC කම්බි දැල්කූඩු03ක් මිළදී ගැනීම | 62 |
| 9 | තුවාල වූ සතුන් ප්‍රවාහනය කිරීම | අල්ලාගත් සතුන් රක්ෂිත ප්‍රදේශවලට මුදා හැරීම | 7 |
| 10 | කුඩා අලි පැටවුන් නිදහස් කිරීම | අලි පැටවුන් 13ක් නිදහස් කරන ලදී. | 490 |
| **එකතුව** | | | **2,794** |

# පරිච්ඡේදය 8
# ඉංජිනේරු අංශය

## 8.1 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වගකීම්

- රක්ෂිත ප්‍රදේශ තුළ භෞතික පහසුකම් වැඩිදියුණු කිරීමේ සහ ඉදිකිරීම් සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- රක්ෂිත ප්‍රදේශ තුළ සහ අවට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තුව සහ ඉදිකිරීම.
- රක්ෂිත ප්‍රදේශ තුළ මාර්ග පද්ධතිය නඩත්තුව සහ ඉදිකිරීම.

## 8.2 ක්ෂේත්‍රයේ ගොඩනැගිලි ඉදිකිරීම සහ අළුත්වැඩියා කිරීම

- ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම

  ක්ෂේත්‍රයේ අළුත්වැඩියා කරන ලද ගොඩනැගිලි සම්බන්ධව වගුව 8.1 හි දැක්වේ.

වගුව **8.1:** 2012 වර්ෂයේ ක්ෂේත්‍ර ගොඩනැගිලි අළුත්වැඩියා

| අනු අංකය | ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය රු.('000) |
|---|---|---|---|
| | **2001-8 ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම** | | |
| 1 | මින්නේරිය ප්‍රධාන පිවිසුමෙහි වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම | සම්පූර්ණ කර ඇත | 124 |
| 2 | පොළොන්නරුව ස.අ. කාර්යාලය වටා කම්බි වැටක් ඉදි කිරීම | සම්පූර්ණ කර ඇත | 865 |
| 3 | මාදුරුඔය ජා.උ. යේ ප්‍රධාන පිවිසුමෙහි ජල සැපයුම් පද්ධතියත් ස්ළාපනය කිරීම | සම්පූර්ණ කර ඇත | 198 |
| 4 | හේරත්ගම, පිබිදුණුගම බීට්ටු කාර්යාලය අළුත්වැඩියා කිරීම | සම්පූර්ණ කර ඇත | 421 |
| 5 | අනුරාධපුර ස.අ. කාර්යාලයේ කුස්සිය අළුත්වැඩියා | සම්පූර්ණ කර ඇත | 252 |
| 6 | හුණුවිලගම ප්‍රධාන කාර්යාලයෙහි ජල සැපයුම් පද්ධතිය උද්‍යාන භාරකරු නාර්යාලය ප්‍රවේශ පත්‍ර කවුළුව අළුත්වැඩියා කිරීම. | සම්පූර්ණ කර ඇත | 3,178 |
| 7 | හේරත්ගම අඩවි ආරක්ෂක කාර්යාලයෙහි සහ නිල නිවාසයෙහි ජල නල පද්ධතියක් ස්ථාපිත කිරීම | සම්පූර්ණ කර ඇත | 421 |
| 8 | ගිරිතලේ වනජීවී පර්යේෂණ හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ ශ්‍රවණාගාරය අළුත්වැඩියා කිරීම | සම්පූර්ණ කර ඇත | 2,154 |
| 9 | හම්බන්තොට අඩවි ආරක්ෂක කාර්යාලය සහ වැසිකිළිය අළුත්වැඩියා කිරීම | සම්පූර්ණ කර ඇත | 968 |
| 10 | වෙහෙරමන්කඩ බීට්ටු කාර්යාලය අළුත්වැඩියා කිරීම | සම්පූර්ණ කර ඇත | 233 |
| 11 | ලුණුගම්වෙහෙර ඒකාබද්ධ නිල නිවාසය අළුත්වැඩියා කිරීම | සම්පූර්ණ කර ඇත | 698 |

| | | | |
|---|---|---|---|
| 12 | කතරගම ස.අ. කාර්යාලයේ ඒකාබද්ධ නිල නිවාසය අළුත්වැඩියා කිරිම | 87% සම්පූර්ණ කර ඇත | 519 |
| 13 | කතරගම ස.අ. කාර්යාලය වටා පස් පිරවීම | 49% සම්පූර්ණ කර ඇත | 49 |
| 14 | කටගමුව ප්‍රවේශ කාර්යාලය සහ මාර්ග බාධකය අළුත්වැඩියා කිරිම | සම්පූර්ණ කර ඇත | 85 |
| 15 | නිමලව, යාල ජා.උ. ඒකාබද්ධ නිල නිවාසය අළුත්වැඩියා කිරිම | 68% සම්පූර්ණ කර ඇත | 477 |
| 16 | බුන්දල ජා.උ. ඒකාබද්ධ නිල නිවාසය අළුත්වැඩියා කිරිම | සම්පූර්ණ කර ඇත | 10 |
| 17 | වීරවිල අඩවි ආරක්ෂක කාර්යාලය අළුත්වැඩියා කිරිම | සම්පූර්ණ කර ඇත | 797 |
| 18 | බුන්දල ජා.උ. ශ්‍රවණාගාරය තෙත් බිම් විද්‍යාගාරයක ලෙස සංවර්ධනය කිරිම | සම්පූර්ණ කර ඇත | 346 |
| 19 | නල්ලතන්නිය අභයභූමියේ කුස්සිය අළුත්වැඩියා කිරිම | 90% සම්පූර්ණ කර ඇත. (වර්ෂාව හේතුවෙන් කාර්යය ප්‍රමාද වී ඇත) | 445 |
| 20 | මිනිපේ ස.අ. කාර්යාලයේ ගොඩනැගිලි 03 අළුත්වැඩියා කිරිම | සම්පූර්ණ කර ඇත | 684 |
| 21 | තංගමලේ අඩවි ආරක්ෂක කාර්යාලය සහ ජල සැපයුම් පද්ධතිය අළුත්වැඩියා කිරිම | සම්පූර්ණ කර ඇත | 382 |
| 22 | සීතාඑළිය අඩවි ආරක්ෂක කාර්යාලය අළුත්වැඩියා කිරිම | සම්පූර්ණ කර ඇත | 326 |
| 23 | සමණළ අඩවිය අඩවි ආරක්ෂක කාර්යාලය වටා වැට අළුත්වැඩියා කිරිම | සම්පූර්ණ කර ඇත | 730 |
| 24 | මාඉඹුල්කන්ද කාර්ය මණ්ඩල නිල නිවාසය අළුත්වැඩියා කිරිම | සම්පූර්ණ කර ඇත | 423 |
| 25 | හොරගොල්ල ජා.උ. වටා වැට අළුත්වැඩියා කිරිම | මීටර් 900 දිගට සම්පූර්ණ කර ඇත | 230 |
| 26 | මාදුරුඔය ජා.උ. යේ උද්‍යාන කාර්යාලය, ෆකෞතුකාගාරය, අඩවි ආරක්ෂක නිල නිවාසය, ජල සැපයුම් පද්ධතිය අළුත්වැඩියා කිරිම (අමතර වැඩ) | සම්පූර්ණ කර ඇත | 41 |
| 27 | මිහින්තලේ වනජීවි සංචාරක නිවාසය වටා වැට සහ ගේට්ටුව අළුත්වැඩියා කිරිම (අමතර වැඩ) | සම්පූර්ණ කර ඇත | 21 |
| 28 | තිඹිරියාමංකඩ වනජීවී සංචාරක නිවාසය අළුත්වැඩියා කිරිම- උඩවලව ජාතික උද්‍යානය (අමතර වැඩ) | සම්පූර්ණ කර ඇත. | 0 |
| 29 | ගිරිතලේ වනජිවි පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ ආරක්ෂක කුටිය ගරාජය අළුත්වැඩියා කිරිම (අමතර වැඩ) | සම්පූර්ණ කර ඇත | 77 |
| 30 | අනුරාධපුර සහකාර අධ්‍යක්ෂ නිල නිවාසයේ වැසිකිළිය ජල සැපයුම් පද්ධතිය අළුත්වැඩියා කිරිම | සම්පූර්ණ කර ඇත | 48 |
| 30 | යාල ජා.උ. වතුර ටැංකිය ඉදි කිරිම (ඉතිරි වැඩ) | සම්පූර්ණ කර ඇත | 1,146 |
| 31 | කාර්මික ගෙවීම් | | 92 |
| 32 | දිය වලවල් සෑදීම-යාල ජා.උ. (ශේෂ වැඩ) | සම්පූර්ණ කර ඇත. | 1,054 |
| 33 | මහවැලි සහකාර අධ්‍යක්ෂ කාර්යාලයට CDM ටෙලිපෝනයක් මිල දී ගැනීම | CDM ටෙලිපෝන් 01 මිල දී ගන්නා ලදී | 6 |

| | | | |
|---|---|---|---|
| 34 | පරණ බුතව වනජීවී සංචාරක බංගලාව අළුත්වැඩියා කිරිම | සම්පූර්ණ කර ඇත | 97 |
| 35 | මධු පාර අභයභූමියේ අඩවි ආරක්ෂක කාර්යාලය, නිල නිවසය සුළු සේවක නිවාසය නල ළිද අළුත්වැඩියා කිරිම | සිදුකරමින් පවතී ( වර්ෂාව හේතුවෙන් ප්‍රමාද වී ඇත) | 320 |
| 36 | විල්පත්තුව ජා.උ. මොල්ලිකුළම ගොඩනැගිලි සහ නල ළිද අළුත්වැඩියා කිරිම | සම්පූර්ණ කර ඇත | 313 |
| 37 | වෙන්ඩර් මණ්ඩල ගෙවීම් | | 200 |
| 38 | මාදුරුඔය ජා.උ. ප්‍රවේශ ගොඩනැගිලි නල ළිද අළුත්වැඩියා කිරිම | සම්පූර්ණ කර ඇත | 464 |
| 39 | කැබලිත්ත ගොඩනැගිලි අළුත්වැඩියා කිරිම | 60% සම්පූර්ණ කර ඇත | 259 |
| **40** | වස්ගමුව ජා.උ. ඒකාබද්ධ නිල නිවාසය අළුත්වැඩියා කිරිම | 38% සම්පූර්ණ කර ඇත | 415 |
| 41 | කුමණ ජා.උ. මාර්ග බාධකයක් ස්ථාපනය කිරිම | සම්පූර්ණ කර ඇත | 34 |
| 42 | හික්කඩුව කාර්යාලයේ වහලය අළුත්වැඩියා කිරිම | සම්පූර්ණ කර ඇත | 12 |
| 43 | බුන්දල ජා.උ. උඩමල්ල බීට්ටු කාර්යාලය අළුත්වැඩියා කිරිම | සම්පූර්ණ කර ඇත | 10 |
| 44 | අලියාමලගල සන්නිවේදන කුළුණ වටා විදුලි වැටක් ඉදි කිරිම | සම්පූර්ණ කර ඇත | 58 |
| | **උප එකතුව** | | **18,536** |

- **නව ගොඩනැගිලි ඉදිකිරීම**

  ඒකාබද්ධ අරමුදලේ ප්‍රතිපාදන යොදවා වර්ෂය තුළ ඉදිකරනු ලැබූ නව ගොඩනැගිලි පිළිබඳ තොරතුරු වගුව 8.2 හි දැක්වේ.

වගුව **8.2:** 2012 වර්ෂයේ නව ගොඩනැගිලි ඉදිකිරීම

| අනු අංකය | ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය රු.('000) |
|---|---|---|---|
| | **2104 :ගොඩනැගිලි සහ ඉදිකිරීම්** | | |
| 1 | වතුර ටැංකි ඉදිකිරීම – යාල ජාතික උද්‍යානය | සම්පූර්ණ කරන ලදී | 40 |
| 2 | ප්‍රධාන කාර්යාලයීය ගොඩනැගිල්ල ඉදිකිරීම් - ඉතිරිව තිබූ වැඩ කටයුතු | සම්පූර්ණ කරන ලදී | 6,004 |
| **3** | වෙනත් | වෙළඳ දැන්වීම් සඳහා ගෙවීම් | 69 |
| 4 | ප්‍රධාන කාර්යාලයීය ගොඩනැගිල්ල කොටස් කිරීම- ඉතිරිව තිබූ වැඩ කටයුතු | කාර්ය මණ්ඩල විවේකාගාරය බෙදාවෙන් කිරීම අවසන් කිරීම- විගණන අංශය | 253 |
| 5 | එළුවන්කුලම-කලාඔය කාර්ය මණ්ඩල නිවාසය ඉදිකිරීම -විල්පත්තුව ජාතික උද්‍යානය | සම්පූර්ණ කරන ලදී | 41 |
| | එකතුව | | **6,407** |

- **ජල ප්‍රභව ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම**

වර්තමානයේ රක්ෂිත ප්‍රදේශ තුළ ඇති වැව් සහ දියවලවල් නියං සමය තුළදී වනසතුන්ගේ ජල අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් නැත. එබැවින් වනසතුන්ගේ ජල අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රමවේද සකස් කර තිබියයුතුය. ඒ සඳහා අදාල ක්‍රියාමාර්ග ලෙස වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් රක්ෂිත ප්‍රදේශ තුළ පවත්නා වැව් සහ වෙනත් ජල ප්‍රභව ප්‍රතිසංස්කරණය සහ අලුත්වැඩියාව සිදුකරන අතර සුදුසු පරිදි වැව් සහ දියවලවල් යන ජල ප්‍රභව අලුතින් ඉදිකිරීමද සිදුකරනු ලැබේ. (වගුව 8.3)

වගුව **8.3** : ජලාශ හා ජල ප්‍රභව නඩත්තුව හා ඉදිකිරීම - 2012

| අනු අංකය | ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය රු.('000) |
|---|---|---|---|
| | **2001-7 :ජල සැපයුම් ප්‍රතිසංස්කරණය** | | |
| 1 | හොරගොල්ල ජලාශය වැඩි දියුණු කිරීම | 45% සම්පූර්ණ කර ඇත | 317 |
| 2 | කහල්ල පල්ලෙකැලේ-කිතුලේවැව ජලාශයේ බැම්ම වටා තණ පිඩලි ඇල්ලීම. | 100% සම්පූර්ණ කර ඇත | 78 |
| 3 | වැඩ ඉතිරිව තිබූ විල්පත්තු ජාතික උද්‍යානයේ අන්දරගොල්ල වැව ජලාශය ප්‍රතිසංස්කරණය | 100% සම්පූර්ණ කර ඇත | 1,114 |
| 4 | රිටිගල-පන්යාය ජලාශය ප්‍රතිසංස්කරණය | 20% සම්පූර්ණ කර ඇත | 100 |
| 5 | හදගිරිය පිවිසුම ආසන්නයේ ජලාශය ප්‍රතිසංස්තරණය | 95% සම්පූර්ණ කර ඇත | 2,458 |
| 6 | මැණික් ගඟ මගින් ජලය සැපයීමට ජල මීටරයක් මිළදී ගැනීම. | සම්පූර්ණ කර ඇත | 26 |
| **7** | වෙනත් | | 481 |
| 8 | මහවැලි අධිකාරියට පාංශු පරීක්ෂණ වාර්තාව සඳහා ගෙවීම් | | 22 |
| | එකතුව | | **4,596** |

## 8.3 මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම

ශ්‍රී ලංකාව තුළ රක්ෂිත ප්‍රදේශ ජාලයේ ක්‍රමික වැඩිවීමක් පසුගිය අවුරුදු කීපය තුළ පෙන්වන අතර මෙම රක්ෂිත ප්‍රදේශ තුළ වනජීවී සම්පත් වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සහ සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස මාර්ග පද්ධතිය ක්‍රමානුකූලව පවත්වාගෙන යාම අත්‍යාවශ්‍යය. ඒ සඳහා දැනට ඇති රක්ෂිත ප්‍රදේශ ජාලය තුළ ක්‍රමවත් මාර්ග පද්ධතියක් තිබීම අත්‍යාවශ්‍යය.

ඒ අනුව යාල, උඩවලව, හෝර්ටන්තැන්න, කුමන, වස්ගමුව සහ මින්නේරිය යන ජාතික උද්‍යාන තුළ මාර්ග පද්ධතිවල ප්‍රතිසංස්කරණය කිරීම් 2012 වර්ෂය තුළදී සිදු කරනලදී. එම විස්තර වගුව 8.4 හි දැක්වේ.

වගුව **8.4:** මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම

| අනු අංකය | ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය රු.('000) |
|---|---|---|---|
| | **2001-6 :මාර්ග ප්‍රතිසංස්තරණය** | | |
| 1 | පියවර 1 - මාදුරුඔය ජාතික උද්‍යානයේ කන්දෙගන්විල-ගුරුකුඹුර මාර්ගය බොරළු නොමැතිව ප්‍රතිසංස්කරණය | 80% සම්පූර්ණ කර ඇත | 3,111 |
| 2 | කුමන මාර්ග ප්‍රතිසංස්කරණය | සම්පූර්ණ කර ඇත | 70 |
| 3 | යාල මාර්ග ප්‍රතිසංස්කරණය | • කි.මී 22 ක් දිගට moter graded කිරීම (යාල,උරණිය-බුතව හන්දිය, වරහාන-කටගමුව, තල්ගස්මණ්කඩ-වරහාන, බුතව අමුණ-ආකාශ චෛත්‍යය, ආකාශ චෛත්‍යය -ගෝනලැහැබ) | 1,728 |
| 4 | උඩවලව පොකුණුතැන්න සංචාරක බංගලාවෙහි මාර්ගය ප්‍රතිසංස්කරණය | සිදු කරමින් පවතී (90%) | 1,405 |
| 5 | ගෝනවිද්දගල සංචාරක බංගලාවෙහි මාර්ගය ප්‍රතිසංස්කරණය - උඩවලව ජා.උ. | සිදු කරමින් පවතී (90% සම්පූර්ණ කර ඇත) | 749 |
| 6 | වස්ගමුව මාර්ග ප්‍රතිසංස්කරණය -**බැදීම්** | සම්පූර්ණ කර ඇත | 98 |
| | **වෙනත්**- කුමන මාර්ග ප්‍රතිසංස්කරණය | සපත්තු පාලම් එකක් ඉදිකර අවසන් කර ඇත. | 760 |
| | **එකතුව** | | **7,921** |
| | **2105-02: නව මාර්ග පද්ධතිය ස්ථාපනය පෝෂක ප්‍රදේශ** | | |
| 78 | කිරිගල්බෙ මාර්ගය ඉදිකිරීම- කුමන ජාතික උද්‍යානය | 100% සම්පූර්ණ කර ඇත | 956 |
| 79 | හෝර්ටන්තැන්න මාර්ග ඉදිකිරීම | ටෙන්ඩර් කැඳවා ඇත. | |
| 80 | මාර්ග පද්ධතිය ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය-විල්පත්තු ජාතික උද්‍යානය | 100% සම්පූර්ණ කර ඇත | 1,000 |
| 81 | අතුරු මාර්ග සංවර්ධනය-මහකන්දරාව සංචාරක බංගලාව | 80% සම්පූර්ණ කර ඇත | 187 |
| 82 | වස්ගමුව ජාතික උද්‍යානයේ කිරිඔය මාර්ගය ඉදිකිරීම (අමතර වැඩ) | සිදු කරමින් පවතී | 1,284 |
| | **එකතුව** | | **3,427** |
| | **අවසාන එකතුව** | | **11,348** |

## 8.4. දැයට කිරුළ ජාතික සංවර්ධන ව්‍යාපෘතිය

වගුව 8.5 : දැයට කිරුළ ක්‍රියාකාරකම්

| අනු අංකය | ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය රු. ('000) |
|---|---|---|---|
| 1 | විල්පත්තුව ජාතික උද්‍යානයේ එළුවන්කුලම-කල්ඔය පිවිසුම ඉදිකිරීම | සම්පූර්ණ කරන ලදී | 361 |
| 2 | විල්පත්තුව ජාතික උද්‍යානයේ එළුවන්කුලම-කල්ඔය කාර්ය මණ්ඩල නිළ නිවාසය ඉදිකිරීම | සම්පූර්ණ කරන ලදී | 41 |
| 3 | විල්පත්තුව ජාතික උද්‍යානයේ එළුවන්කුලම-කල්ඔය අඩවි ආරක්ෂක නිළ නිවාසය ඉදිකිරීම | සම්පූර්ණ කරන ලදී | 150 |
| 4 | විල්පත්තුව ජාතික උද්‍යානයේ මොල්ලිකුලම අඩවි ආරක්ෂක නිළ නිවාසය ඉදිකිරීම | සම්පූර්ණ කරන ලදී | 1,173 |
| 5 | විල්පත්තුව ජාතික උද්‍යානයේ මොල්ලිකුලම අඩවි ආරක්ෂක කාර්යාලය ඉදිකිරීම | සම්පූර්ණ කරන ලදී | 426 |
| 6 | විල්පත්තුව ජාතික උද්‍යානයේ මොල්ලිකුලම ඒකාබද්ධ නිළ නිවාසය ඉදිකිරීම | සම්පූර්ණ කරන ලදී | 587 |
| 7 | විල්පත්තුව ජාතික උද්‍යානයේ මාරවිල බීට්ටු කාර්යාලය ඉදිකිරීම | 25% සම්පූර්ණ කරන ලදී | |
| 8 | තන්තිරිමලේ පිවිසුමෙහි ගොඩනැගිලි අනෙකුත් වැඩ සමග ඉදිකිරීම | සම්පූර්ණ කරන ලදී | 3,735 |
| 9 | මහවිලච්චිය පිවිසුමෙහි ගොඩනැගිලි අනෙකුත් වැඩ සමඟ ඉදිකිරීම | විදුලි බලය සමග සම්පූර්ණ කර ඇත | 5,870 |
| 10 | හුණුවිලගම ආපනශාලාව සහ අමතර වැඩ සහිත අලෙවි කුටිය ඉදිකිරීම | 30% සම්පූර්ණ කරන ලදී | |
| 11 | විල්පත්තුව ජාතික උද්‍යානයේ නාලන්ද ජලාශය ප්‍රතිසංස්කරණය | 90% සම්පූර්ණ කරන ලදී | 1,434 |
| 12 | විල්පත්තුව ජාතික උද්‍යානයේ හටමුණ ජලාශය ප්‍රතිසංස්කරණය | සම්පූර්ණ කරන ලදී | 473 |
| 13 | විල්පත්තුව ජාතික උද්‍යානයේ දෙමටමල්වැව ජලාශය ප්‍රතිසංස්කරණය | සම්පූර්ණ කරන ලදී | 1,547 |
| 14 | විල්පත්තුව ජාතික උද්‍යානයේ හිග්ගොඩවැව ජලාශය ප්‍රතිසංස්කරණය | සම්පූර්ණ කරන ලදී | 654 |
| 15 | විල්පත්තුව ජාතික උද්‍යානයේ බෝගස්වැව ජලාශය ප්‍රතිසංස්කරණය | සම්පූර්ණ කරන ලදී | 1,253 |
| 16 | විල්පත්තුව ජාතික උද්‍යානයේ හඳපාන්ගොඩවැව ජලාශය ප්‍රතිසංස්කරණය | සම්පූර්ණ කරන ලදී | 1,848 |
| 17 | විල්පත්තුව ජාතික උද්‍යානයේ වීරවිල වැව ජලාශය ප්‍රතිසංස්කරණය | සිදු කරමින් පවතී | |
| 18 | තන්තිරිමලේ පිවිසුමෙහි නව මාර්ගය කි.මී.100ක් දක්වා ඉදිකිරීම | 95% සම්පූර්ණ කරන ලදී | 5,990 |
| 19 | විල්පත්තුව ජාතික උද්‍යානයේ කඳවුරු බිම් 06ක් ඉදිකිරීම | 01 කඳවුරු බිමක් සම්පූර්ණ කර ඇත | 346 |
| 20 | විල්පත්තුව ජාතික උද්‍යානයේ මාර්ග ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය | සිදු කරමින් පවතී | 793 |
| 21 | විලච්චිය පිවිසුමෙහි කාර්යාලයට විදුලිය සැපයීම | සම්පූර්ණ කරන ලදී | 417 |
| 22 | පුවත්පත් වෙළඳ දැන්වීම් | | 6,343 |
| | එකතුව | | **33,441** |

# පරිච්ඡේදය 9
# පරිපාලන අංශය

## 9.1 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වගකීම්

- මානව සම්පත් සහ සාමාන්‍ය පරිපාලන සැලසුම් පිළියෙල කිරීම.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම.
- කාර්ය මණ්ඩලයට අදාල ස්ථානමාරු සම්බන්ධව කටයුතු කිරීමසේවා දීර්ඝ, විශ්‍රාම, විශ්‍රාම වැටුප් සහ වැන්දඹු සහ අනත්දරු අරමුදල් පිළිබඳ කටයුතු සිදුකිරීම.
- විනය කටයුතු සම්බන්ධව කටයුතු කිරීම.
- වන්දි ගෙවීම් කටයුතු
- කාර්යයසාධන කටයුතු සහ වැටුප් වර්ධක කටයුතු
- ක්ෂේත්‍ර ගොඩනැගිලි අලුත්වැඩියාව සහ ඉදිකිරීම.

## 9.2. බඳවා ගැනිම් පරිපාටි

පහත සදහන් ආකාරයට බදවා ගැනීම් සිදුකොට ඇත.

**වගුව 9.1:** බඳවා ගැනීම් - 2012

| තනතුර | බදවාගැනීම් සංඛ්‍යාව |
|---|---|
| වනජීවී අඩවි ආරක්ෂක - III ශ්‍රේණිය | 33 |
| බංගලා සහකාර | 08 |
| රියදුරු | 16 |

## 9.3 උසස්වීම්

2012 වර්ෂය තුළ සිදු කළ උසස්වීම් පහත දක්වා ඇත.

**වගුව 9.2**: උසස්වීම් - 2012

| තනතුර | නිළධාරීන් සංඛ්‍යාව |
|---|---|
| වනසත්ව නියාමක | 38 |
| වනසත්ව අඩවි සහකාර | 105 |
| වනසත්ව අඩවි ආරක්ෂක - III ශේණිය | 28 |
| වනසත්ව අඩවි ආරක්ෂක - II ශේණිය | 10 |
| ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II/II පංතියේ නිළධාරීන් II/I පංතියට උසස්වීම් ලැබීම සහ උසස් වීම් ලබා නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු ලැබීම | 05 |

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ පළමු පන්තියේ නිළධාරියෙකු වන එච්.ඩී.රත්නායක මහතා,වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත් කෙරුණි.

## 9.4 කාර්යක්ෂමතා කඩයිම් විභාග

පහත දැක්වෙන විභාගයන් පවත්වා ප්‍රතිඵල නිකුත් කර ඇත.

**වගුව 9.3:** කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2012

| විභාගය | විභාග අපේක්ෂකයින් සංඛ්‍යාව |
|---|---|
| වනසත්ව නියාමකයින් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 114 |
| වනසත්ව අඩවි සහකාර සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 58 |
| වනසත්ව අඩවි ආරක්ෂකයින් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය - III ශ්‍රේණිය | 28 |
| වනසත්ව අඩවි ආරක්ෂකයින් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය - II ශ්‍රේණිය | 14 |
| කාර්මික සහකාර තනතුර සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 02 |
| නි.අධ්‍යක්ෂ(පර්යේෂණ හා පුහුණු) සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 01 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ තනතුර සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 02 |
| සංචාරක සේවා නිළධාරී තනතුර සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 01 |

## 9.5 ණය පහසුකම්

පහත දැක්වෙන ණය පහසුකම් ලබා දී ඇත.

**වගුව 9.4:** ණය පහසුකම් - 2012

| ණය පහසුකම් වර්ගය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| හදිසි ණය | 371 |
| පාපැදි ණය | 27 |
| ණය ගෙවීම සඳහා ණය | 13 |
| දේපල ණය | 12 |

## 9.6. සහ විනය පරීක්ෂණ

2012 වර්ෂයේ විනය පරීක්ෂණ 03 ක් පවත්වා නිර්දේෂ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමුකර ඇත.

## 9.7. අග්‍රහාර අරමුදල් ප්‍රතිලාභ ගෙවීම

අග්‍රහාර අරමුදල් පහත පරිදි ගෙවා ඇත.

**වගුව 9.5**: අග්‍රහාර අරමුදල් ගෙවීම - 2012

| අග්‍රහාර අරමුදලේ ප්‍රතිලාභ | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| රෝහල්ගතවීම් | 60 |
| ඇස් කණ්ණාඩි | 62 |
| දරු ප්‍රසූති සඳහා | 11 |

දුෂ්කර දීමනා ගෙවීම් රු.500 සිට රු.2500 දක්වා ඉහල නංවා ඇත.

## පරිච්ඡේදය 10
## ගිණුම් අංශය

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය දෙපාර්තමේන්තුවට අදාල ගිණුම් කටයුතු සියල්ල සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි. මෙම අංශය මගින් මුදල් අමාත්‍යංශයේ විවිධ දෙපාර්තමේන්තු සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අතර සම්බන්ධීකරණය සිදුකිරීම ප්‍රධාන වශයෙන් කැපී පෙනේ.

### 10.1 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වගකීම්

- දෙපාර්තමේන්තුවේ ආදායම් සහ වියදම් ගිණුම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පරිපාලනය කිරීම සහ වෙනත් අදාල කටයුතු සිදුකිරීම.
- මහාභාණ්ඩාගාරයෙන් සහ වෙනත් ආයතන වලින් ලැබෙන අරමුදල් සහ ප්‍රතිපාදන සම්බන්ධ මුල්‍ය පාලනයන්
- දෙපාර්තමේන්තුවට අදාල ගිණුම් හා මුල්‍ය තොරතුරු වර්ගීකරණය කර භාණ්ඩාගාරයට, අමාත්‍යංශයට සහ දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ වෙත ලබාදීම
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය කරනු ලබන වාර්ෂික ගිණුම්, ආදායම් ගිණුම්, රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් ගිණුම සහ විසර්ජන ගිණුම සහ වනජීවී සංරක්ෂණ අරමුදලේ ගිණුම පවත්වාගෙන යාම.

### 10.2 ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම.

- නව ප්‍රධාන කාර්යාලය ප්‍රාදේශීය වනජීවී කාර්යාලය සහ සංචාරක නිවාස සඳහා නව ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගන්නා ලදී.

වගුව **10.1**: 2012 වර්ෂයේ කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ සඳහා වියදම්

| අනු අංකය | ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මුල්‍යමය ප්‍රගතිය (රු. '000) |
|---|---|---|---|
| 1 | අධි ශ්‍රීතකරණ | 01 අධි ශීතකරණයක් මිළදී ගන්නා ලදී | 49 |
| 2 | ඡායා පිටපත් | ඡායාපිටපත් 5ක් මිළදී ගන්නා ලදී | 1,034 |
| 3 | ලැප්ටොප් පරිගණක (Note Book) | ලැප්ටොප් පරිගණක1ක් මිළදී ගන්නා ලදී | 110 |
| 4 | පරිගණක මිළදී ගැනීම | පරිගණක14 ක් මිළදී ගන්නා ලදී | 965 |
| 5 | මුද්‍රණ යන්ත්‍ර | මුද්‍රණ යන්ත්‍ර 7ක් මිළදී ගන්නා ලදී | 203 |
| 6 | UPS බැටරි | UPS බැටරි 16 ක් මිළදී ගන්නා ලදී | 87 |
| 7 | ෆැක්ස් යන්ත්‍රය | ෆැක්ස් යන්ත්‍ර 1 ක් මිළදී ගන්නා ලදී | 17 |
| 8 | කාර්යාල මේස (දැව) | 8 මේස මිළදී ගෙන ඇත | 139 |
| 9 | කාර්යාල පුටු (දැව) | 54 පුටු මිළදී ගෙන ඇත | 196 |
| 10 | ප්ලාස්ටික් පුටු | 40 පුටු මිළදී ගෙන ඇත | 33 |
| 11 | පරිගණක මේස | 4 පරිගණක මේස මිළදී ගෙන ඇත | 20 |
| 12 | පරිගණක පුටු | 8 පරිගණක පුටු මිළදී ගෙන ඇත | 34 |
| 13 | මුදල් සේප්පු(යකඩ) | 01 මිළදී ගෙන ඇත | 31 |

| | | | |
|---|---|---|---|
| 14 | වානේ අල්මාරි | වානේ අල්මාරි 6 ක් මිළදී ගෙන ඇත | 66 |
| 15 | වානේ කැබිනට් (4 ලාච්චු) | සම්පූර්ණයි | 71 |
| 16 | විධායක මේස | 2 සම්පූර්ණයි | 136 |
| 17 | විධායක පුටු | 3ක් මිළදී ගෙන ඇත | 26 |
| 18 | සිතියම් රදවන | සිතියම් රදවන 05ක් මිළදී ගෙන ඇත | 190 |
| | සංචාරක බංගලා ගෘහ භාණ්ඩ | | |
| 19 | එඩරඇටමුල්ල සංචාරක බංගලාව සඳහා ගෘහභාණ්ඩ මිළදී ගැනීම | යුගල ඇඳන් 02 , ගමන්මළු රැඳවුම් 02, 01 කෑම මේස , කෑම්මේස පුටු 12, තනි ඇඳන් 10, තුවා රදවන 04, වටකුරු ස්ටූල් 01 | 359 |
| 20 | විදුලි කේතල මිළදී ගැනීම | 01 මිළදී ගෙන ඇත | 5 |
| 21 | වෙනත් | කාට්රිජ් 01 සහ ස්ටෙප්ලර් මැෂින් 04, 01 බිම සිටවන විදුලි පංකා 01, වයර් දිගු 01, බහු පේනුව 12, වායු සමීකරන 03, CDMA දුරකතන 02, 8GB pen drive **01**, ගෑස් උදුන **06** මිළදී ගෙන ඇත | 203 |
| එකතුව | | | 3,974 |

- සාර්ථක සංරක්ෂණ ක්‍රියාවලියක් සඳහා ආධාරවන පරිදි විවිධ වර්ගයේ යන්ත්‍ර හා උපකරණ රුපියල් **808,000.00**ක් වියදම් කර මිලදී ගෙන ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල වෙත ලබාදෙන ලදී.

වගුව **10.2:** යන්ත්‍රෝපකරණ සඳහා වියදම් 2012

| අනු අංකය | ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු. '000) |
|---|---|---|---|
| 1 | Laptop පරිගණක ප්‍රතිසම්පාදනය | සම්පූර්ණයි | 33 |
| 2 | බෝට්ටු මිළදී ගැනීම- ගල්ඔය ජාතික උද්‍යානය | 01 බෝට්ටුවක් මිළදීගෙන ඇත | 522 |
| 3 | තත්වයෙන් යුතු බයිසිකල් 04ක් මිළදී ගැනීම- පරෙවි දූපත් සහ පානම බීට්ටු කාර්යාලය | සම්පූර්ණයි | 41 |
| 4 | AC ඒකකය | ඒකක 03ක් | 212 |
| 5 | යන්ත්‍රෝපකරණ සහ උපකරණ ප්‍රත්සංස්කරණය | ඩීසල් මැෂින් මිළදී ගෙන ඇත. | 425 |
| එකතුව | | | **1,233** |

## 10.3 වනජීවී සංරක්ෂණ අරමුදල (WPF)

ශ්‍රී ලංකාව තුළ වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා සහය ලබාගැනීමේ අරමුණෙන් 1967 දී පිහිටුවන ලද මෙම අරමුදලේ අරමුණු පහත දැක්වේ.

1. වනසතුන් ආරක්ෂාව සහ සංරක්ෂණය සඳහා මහජනතාවගේ දායකත්වය සහ සහයෝගය වැඩි කර ගැනීම
2. වනජීවී රක්ෂිත ප්‍රදේශ නඩත්තු කිරීම
3. වනජීවී සංරක්ෂණ සඳහා දක්වනු ලබන දායකත්වය අගය කිරීම සඳහා වනජීවී සංරක්ෂණ නිලධාරීන්ට සහ මහජනතාවට ත්‍යාග මුදල් සහ වෙනත් ප්‍රසාද දීමනා ගෙවීම.
4. වනජීවී අපරාධවලට එරෙහිව තොරතුරු ලබාදෙන්නන් සඳහා ප්‍රසාද දීමනා ගෙවීම.

වගුව 10.3 හි දැක්වෙන්නේ වන සංරක්ෂණ අරමුදල එහි අරමුණු අනුව පෙර සැලසුම් කරන ලද වනසංරක්ෂණ කටයුතු සඳහා ලබාදුන් දායකත්වයයි. 2012 වර්ෂයේ වනජීවී සංරක්ෂණ අරමුදලේ අයවැය විස්තරාත්මකව 10.5 වගුවේ දක්වා ඇත.

වගුව **10.3:** වනජීවි සංරක්ෂණ අරමුදලේ වියදම් (2005-2011)

| වසර | ඇස්තමේන්තු ගත වියදම (රු.000) | සත්‍ය වියදම (රු. 000) | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|
| 2005 | 56 | 53 | 95% |
| 2006 | 58 | 57 | 98% |
| 2007 | 75 | 56 | 75% |
| 2008 | 112 | 81 | 72% |
| 2009 | 134 | 99 | 74% |
| 2010 | 161 | 121 | 75% |
| 2011 | 242 | 206 | 85% |
| 2012 | 510 | 406 | 80% |

## 10.4. අයවැය විස්තර

2012 වර්ෂය සඳහා වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාලව අයවැය විස්තර පහත දැක්වේ.

ශීර්ෂය - 284 - වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව
වැඩසටහන : 01 මෙහෙයුම් කටයුතු
ව්‍යාපෘතිය : 01 - පරිපාලනය සහ ආයතන සේවා

දෙපාර්තමේන්තුවේ වියදම් සම්බන්ධව කාර්යය සාධනය විදහා දැක්වේ.

වගුව **10.4:** 2012 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අයවැය විස්තර

| විෂයාංකය | පරමාර්ථය | ඇස්තමේන්තුව (රු. "000") | වියදම (රු. "000") | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| **ප්‍රාග්ධන වත්කම් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම** | | | | |
| **284-01-01-01-2001** | **ගොඩනැගිලි සහ ඉදිකිරීම්** | | | |
| 2001-1 | රක්ෂිත ප්‍රදේශ ජාලය ස්ථාපිතකිරීම | 7,500 | 7,500 | 100% |
| 2001-2 | පාරිසරික සංචාරක කළමනාකරණය | 11,000 | 6,247 | 57% |
| 2001-3 | ජනවිඥිදුම්කරණ වැඩසටහන | 1,680 | 1,650 | 98% |
| 2001-4 | අන්තුරායට ලක් වූ ජීවි විශේෂ සංරක්ෂණය | 3,500 | 2,825 | 81% |
| 2001-5 | තොරතුරු හා සන්නිවේදන පද්ධතිය | 2,000 | 1,427 | 71% |
| 2001-6 | මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය | 11,000 | 7,921 | 72% |
| 2001-7 | ජලප්‍රභව ප්‍රතිසංස්කරණය | 11,000 | 4,596 | 42% |
| 2001-8 | ගොඩනැගිලි ප්‍රතිසංස්තරණය | 23,000 | 18,536 | 81% |
| **284-01-01-01-2002** | මැෂින්, යන්ත්‍ර හා උපකරණ | 2,500 | 425 | 17% |
| **284-01-01-01-2003** | වාහන | 7,000 | 6,750 | 96% |

| | | | | |
|---|---|---|---|---|
| **ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම** | | | | |
| **284-01-01-01-2102** | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 4,000 | 3,974 | 99% |
| **284-01-01-01-2103** | මැෂින් හා යන්ත්‍ර හා උපකරණ | 850 | 808 | 95% |
| **284-01-01-01-2104** | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 6,453 | 6,407 | 99% |
| **284-01-01-01-2105** | **ඉඩම් සහ ඉඩම් සංවර්ධනය** | | | |
| 2105-1 | වනජීවී වාසස්ථාන සුපෝෂණය | 7,500 | 4,767 | 64% |
| 2105-2 | රක්ෂිත ප්‍රදේශ තුළ මාර්ග පද්ධතිය ස්ථාපනය | 3,500 | 3,427 | 98% |
| **284-01-01-01-2401** | **හැකියාවන් ගොඩනැගීම** | | | |
| 2401-1 | පර්යේෂණ සහ පුහුණු | 2,000 | 1,899 | 95% |
| 2401-2 | සංරක්ෂණය, අධ්‍යාපනය, විස්තාරනය හා විවරණය | 3,755 | 3,190 | 85% |
| 2401-3 | ආරක්ෂාව සහ නීති ක්‍රියාත්මක කිරීම් | 6,000 | 6,087 | 101% |
| 2401-4 | ගිරිතලේ ජාතික වනජීවී පුහුණු කේන්ද්‍රය | 8,000 | 6,504 | 81% |
| **284-01-01-02-2104** | **අලි සංරක්ෂණය – 'ගජමිතුරෝ'** | 200,000 | 175,066 | 88% |
| **284-01-01-05-2104** | **ලුණුගම්වෙහෙර සහ හොරොව්පතාන වනඅලි සංරක්ෂණ උද්‍යාන ස්ථාපිත කිරීම** | 200,000 | 22,000 | 11% |
| **284-01-01-06-2502** | දැයට කිරුළ සංවර්ධන වැඩසටහන **(විල්පත්තුව ජාතික උද්‍යානය සංවර්ධනය)** | 126,000 | 67,126 | 53% |
| **එකතුව (රු. '000)** | | **648,239** | **359,132** | **55%** |

වගුව **10.5:** 2011.12.31 ට පෙර වනජීවි සංරක්ෂණ අරමුදල් ගිණුමේ අයවැය

| **විස්තරය** | 2012 | (රු.) |
|---|---|---|
| 2012.01.01 දිනට ශේෂය<br>ලැබීම් | | **792,586,391.61** |
| උද්‍යාන පිවිසුම් ගාස්තු | 467,988,101.40 | |
| ඇත්අතුරු සෙවනේ පිවිසුම් ගාස්තු | 5,6711,157.69 | |
| සේවා ගාස්තු | 90,231,239.05 | |
| වාහන පිවිසුම් ගාස්තු | 34,091835.09 | |
| කැපකරු මාපිය වැඩසටහන | 4,852,551.97 | |
| උසාවිය විසින් නියම කරන ලද දඩ මුදල් | 26,657,983.00 | |
| පරිත්‍යාග | 635,439.96 | |
| ජාතික උද්‍යාන තුළ චිත්‍රපටගත කිරීමේ අයකිරීම් | 8,372,877.38 | |
| පොත්, සගරා සහ වාර සගරාව | 493,574.45 | |
| සත්ත්ව හා ශාක කොටස් සඳහා ආනයන අපනයන බලපත්‍ර | 491,800.00 | |
| සංචාරක බංගලාවන්හි රෙදිපිළි ගාස්තු | 2,203,887.69 | |
| කදවුරුබිම් වෙන්කර ගැනීමට අදාල ගාස්තු | 3,710,559.22 | |
| ගෘහස්ථ අලි ලියාපදිංචිය | 64,800.00 | |
| මසුන් ඇල්ලීමේ බලපත්‍ර | 49,250.00 | |
| ලී සහ දර අලෙවිය | - | |
| වැලි විකිණීම | 43,165,325.00 | |
| දළ ලියාපදිංචි කිරීම් | 4,000.00 | |
| ආයෝජන ආදායම් | 40,726,183.52 | |
| | | **729,410,565.42** |
| | | **1,521,996,957.03** |
| **ගෙවීම්** | | |
| ලිපිද්‍රව්‍ය | 265,051.00 | |
| ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ නඩත්තුව | 2,203,079.30 | |
| සේවා ගාස්තු | 65,869,519.86 | |
| මරණයට සහ පිඩාවන්ට පත් වූ වනජීවි නිලධාරීන්ගේ සඳහා වන්දි ගෙවීම | 125,000.00 | |
| ස්වෙච්ඡා මාර්ගෝපදේශකයන් සඳහා වූ දීමනා | 43,429,875.00 | |
| සත්ත්ව ආහාර | 26,584,213.92 | |
| වනසතුන්ට වන හානි සඳහා ප්‍රතිකාර කිරීම් | 15,899,702.00 | |
| ඉන්ධන සඳහා | 10,461,842.78 | |
| ගුවන්විදුලි පණිවිඩ ජාලය සඳහා ගෙවීම් | 3,528,196.10 | |
| දිරිදීමනා | 4,077,104.36 | |
| අලි ප්‍රවාහනය | 6,026,147.56 | |
| ඖෂධ සැපයීම් | 11,333,174.11 | |
| ගමන් වියදම් | 13,480,587.04 | |
| ජල හා විදුලි බිල් ගෙවීම් | 3,474,548.01 | |
| තුවක්කු බලපත්‍රය | 216,600.00 | |
| අන්තරායට ලක් වූ ජීවි විශේෂ සංරක්ෂණය | 532,764.00 | |
| පුළුස්සන ලද අලි කොටස්කිරීම | 380,629.00 | |
| නීති ගාස්තු | 687,520.00 | |
| ලොන්ඩරි ගාස්තු | 226,500.00 | |
| වාහන අලුත්වැඩියාව | 362,249.00 | |
| අනියම් කම්කරුවන් සඳහා වැටුප් | 8,372,778.99 | |

| | | |
|---|---|---|
| ගිගුම් අවි සහ සංඥා අවි මිලදී ගැනීම | 5,790,700.36 | |
| අවමගුල් කටයුතු සඳහා අයකෙරෙන ගාස්තු | 43,526,689.00 | |
| වාහන මිළදී ගැනීම් | 27,799,351.84 | |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය | 40,726,183,52 | |
| වෙනත් | 16,160,691,37 | |
| වනජීවීන් හා සංචාරකයින් සඳහා ජාතික උද්‍යාන තුළ පහසුකම් වැඩිදියුණු කිරීම | 54,931,010.24 | 406,471,708.36 |
| 2012.12.31 දිනට ශේෂය | | **1,115,525,248.67** |